ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

இலங்கை இறப்பர் ஆராய்ச்சி நிறுவனம்

RUBBER RESEARCH INSTITUTE OF SRI LANKA



2024

Annual Report ஆண்டறிக்கை வார்ஷிக வார்තාව

පටුන

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය	3
දැක්ම සහ මෙහෙවර	4
අරමුණු සහ ප්‍රතිපත්ති	5
සංවිධාන ව්‍යුහය	6
කළමණාකරණ මණ්ඩලය හා කමිටු	7
වතු කමිටුව	8
විගණන හා කළමනාකරණ කමිටුව	8
විද්‍යාත්මක කමිටුව	8
අර්ථ සාධක අරමුදල් කමිටුව	8-14
කාර්ය මණ්ඩලය	14
සභාපතිතුමාගේ වාර්තාව	17
අධ්‍යක්ෂතුමාගේ වාර්තාව	25
පර්යේෂණ හා සංවර්ධන ජයග්‍රහණ	27
වැඩි දියුනු කරන ලද ක්ලෝන නිපදවීම	34
රබර් වගාව සඳහා අවශ්‍ය කෘෂි පිළිවෙත් දියුණු කිරීම	34-36
ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණයන් නව්‍යකරණය කිරීම හා ව්‍යාප්තිය	36-38
රබර් කර්මාන්තය සඳහා තාක්ෂණය නිපදවීම හා ගුණත්වය තහවුරු කිරීම	48
විශේෂ ක්‍රියාකාරකම්	44
පර්යේෂණ දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරකම් (ශෂ්‍ය විද්‍යා දෙපාර්තමේන්තු /අංශ සහ ඒකක)	45
ප්‍රවේනි හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව	45
ශාක විද්‍යා දෙපාර්තමේන්තුව	45

ශාක ව්‍යාධි හා ක්ෂුද්‍ර ජීවී විද්‍යා දෙපාර්තමේන්තුව 46
පාංශු හා ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තුව 47
පෙජව රසායන හා කායික විද්‍යා දෙපාර්තමේන්තුව 47
උපදේශක සේවා දෙපාර්තමේන්තුව 47-48
පෙජවමිතික අංශය 48
උපයෝගීතා පර්යේෂණ ඒකකය 49
කෘෂි ආර්ථික විද්‍යා අංශය 49-50
පුස්තකාල හා ප්‍රකාශන ඒකකය 50
ශ්‍රව්‍ය දෘශ්‍ය හා තොරතුරු තාක්ෂණ ඒකකය 50
රබර් තාක්ෂණ දෙපාර්තමේන්තු 50
රබර් තාක්ෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව 50-52
බහු අවයවික රසායනික දෙපාර්තමේන්තුව 52
දළ රබර් හා රසායනික විශ්ලේෂණ දෙපාර්තමේන්තුව 52-53
දළ රබර් සැකසුම් සංවර්ධන හා රසායනික ඉංජිනේරු දෙපාර්තමේන්තුව 53
වතු සහ උප මධ්‍යස්ථාන 53
ඩාර්ටන්ෆීල්ඩ් වතුයාය 53-54
කුරුවිට උප මධ්‍යස්ථානය 54
පොල්ගහවෙල මධ්‍යස්ථානය 54-55
මොණරාගල උප මධ්‍යස්ථානය 55
මූල්‍ය ප්‍රකාශන 56
විගණකාධිපතිවරයාගේ වාර්තාව 91
පසුගිය වසර දහය තුළ ආයතනික ලැබීම් සහ වියදම් සාරාංශය (2014-2023) 99

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය
ඩාර්ටන්ෆීල්ඩ්, අගලවත්ත

ශ්‍රී ලංකාවේ රබර් පර්යේෂණවල මූලාරම්භය කළුතර දිස්ත්‍රික්කයේ වැවිලිකරුවන් කණ්ඩායමක් රබර් ක්ෂීරය කැටි ගැසීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා රසායනඥයකුගේ සේවය ලබා ගත් 1909 වසර දක්වා විහිදී යයි. 1913 වසරේදී රබර් පර්යේෂණ යෝජනා ක්‍රමයක් ස්ථාපනය කිරීම සඳහා රබර් පර්යේෂණ සිදු කිරීම පසුකාලීනව තවදුරටත් ව්‍යාප්ත කරන ලද අතර 1951 දී මෙම ආයතනය ලංකා (වර්තමානයේ ශ්‍රී ලංකා) රබර් පර්යේෂණායතනය ලෙස හඳුන්වන ලදී. මේ අනුව, ලෝකයේ රබර් පිළිබඳව පෞරාණිකම පර්යේෂණායතනය බවට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය (RRISL) පත් ව තිබේ. පැළෑටි අභිජනනය, කෘෂිකාර්මික කළමනාකරණ පරිචයන් හා දළ රබර් රසායනය ආදී ක්ෂේත්‍රවලින් රබර් පර්යේෂණ ක්ෂේත්‍රය සඳහා ප්‍රෞඪ සේවාවක් සිදු කිරීම පිළිබඳව රබර් පර්යේෂණායතනය (RRISL) වාර්තා ගත වී තිබේ. රබර් කර්මාන්තයේ ප්‍රතිලාභය උදෙසා රබර් වගාවේ හා රබර් පිරිසැකසුම්කරණයේ සියළු අංශ පිළිබඳව පර්යේෂණ සිදු කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යවස්ථාපිත පරිපාලන වගකීම පැවරී ඇති ශ්‍රී ලංකා නියෝජිතායතනය වන්නේ ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයයි. බෝගයේ ජීව විද්‍යාව හා ස්වභාවික රබර්වල රසායනය හා නිෂ්පාදන තාක්ෂණය යන අංශ දෙකම සම්බන්ධයෙන් රබර් ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම සඳහා මෙම ආයතනය විශේෂීකරණය වී තිබේ. තවද, තාක්ෂණ හුවමාරු ක්‍රියාකාරකම් හා ව්‍යාප්ති නිලධාරීන් හා අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා සුදුසුකම් ලබාදීම සම්බන්ධයෙන් ද මෙම ආයතනය කැප වී කටයුතු කරයි. ඒ අනුව, මෙම පර්යේෂණායතනය සතුව ජෙව විද්‍යාත්මක පර්යේෂණ දෙපාර්තමේන්තු 5 ක් පවතී. ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, ප්‍රවේණි හා ශාක අභිජනනය, ශාක ව්‍යාධිවේද හා ක්ෂුද්‍රජීව විද්‍යා, පාංශු සහ ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තු හා ජෙව රසායන හා ශාක කායික විද්‍යා යන ජෙව විද්‍යාත්මක දෙපාර්තමේන්තු පහ ද, දළ රබර් සැකසුම් සංවර්ධන හා රසායනික ඉංජිනේරු, දළ රබර් හා රසායන විශ්ලේෂණ, බහු අවයවික රසායන දෙපාර්තමේන්තුව හා දළ රබර් තාක්ෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව යන රසායනික දෙපාර්තමේන්තු ද තාක්ෂණය හුවමාරු කිරීම් සඳහා වන උපදේශන සේවා දෙපාර්තමේන්තුව සහ උපයෝගිතා පර්යේෂණ, ජෙවමිතික, කෘෂි ආර්ථික, ශ්‍රව්‍ය දෘශ්‍ය හා තොරතුරු තාක්ෂණ හා පුස්තකාල යන ඒකකවලින් ද මෙම පර්යේෂණායතනය සමන්විත වේ.



දැක්ම

රබර් කර්මාන්තය වෙත උසස් ගුණාත්මක භාවයෙන් යුත් විද්‍යාත්මක තාක්ෂණික ක්‍රම සපයා දෙන විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානය බවට පත් වීම ආයතනයේ දැක්ම වේ.

මෙහෙවර

ආර්ථික වශයෙන් ඵලදායක මෙන්ම පාරිසරක වශයෙන් හිතකාමී තිරසාර නවෝත්පාදන වැඩිදියුණු කිරීම මගින් ද, රබර් කර්මාන්තයේ පාර්ශ්වකරුවන් වෙත පුහුණු කිරීම් හා උපදේශන සේවා තුළින් නවතම තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම මගින් ද රබර් කර්මාන්ත අංශයට පුනර්ජීවයක් ලබා දීම ආයතනයේ මෙහෙවර වේ.


අරමුණු

- ජාතික ඵලදායිතාව අන්තර්ජාතික මට්ටමට උසස් කිරීම.
- ඉහළ යන ඉල්ලුමට සරිලන පරිදි දේශීය ස්වභාවික රබර් නිෂ්පාදනය නඟා සිටුවීම.
- භූමිය, ශ්‍රමය හා අනෙකුත් සම්පත් ප්‍රශස්ත මට්ටමින් තිරසාරව භාවිත කිරීම.
- රබර් සඳහා දේශීය මට්ටමින් වටිනාකම් එකතු කිරීම උපරිම මට්ටමින් සිදු කිරීම.
- පුද්ගල නිපුණතා සංවර්ධනය මෙන්ම රබර් පර්යේෂණායතනයේ සේවක පිරිස්වල ස්වයං සංවර්ධනය දිරිගැන්වීම මගින් ආයතනයේ සංවිධානාත්මක ඵලදායිතාවය වැඩි දියුණු කිරීම.

ප්‍රතිපත්ති

- රබර් නිෂ්පාදනය සහ පිරිසැකසීම සම්බන්ධ සෑම අංශයකම පර්යේෂණ හා ව්‍යාප්ති සේවා අඛණ්ඩව පවත්වාගෙන යෑම.
- පරිසර හිතකාමී හා තිරසාර කෘෂිකර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව සිදු කිරීම.
- පුහුණු කිරීම් හා උපදේශන සේවා තුළින් වැඩිදියුණු කළ තාක්ෂණික ක්‍රම රබර් කර්මාන්තයේ පාර්ශ්වකරුවන්ට හඳුන්වා දීම.

සංවිධාන ව්‍යුහය


සභාපති/රබර් පර්යේෂණ මණ්ඩලය
වතු කළමනාකරණය පිළිබඳ උපදේශක කමිටුව
විගණන හා කළමනාකරණ කමිටුව
අධ්‍යක්ෂ / ප්‍ර.වි.නි.
අතිරේක අධ්‍යක්ෂ
අභ්‍යන්තර විගණන ඒකකය
මණ්ඩල කාර්යාලය
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (තාක්ෂණ)
දළ රබර් හා රසායන විශ්ලේෂණ දෙපාර්තමේන්තුව
රබර් තාක්ෂණික හා සංවර්ධන දෙපාර්තමේන්තුව
නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය (රත්මලාන)
බහු අවයවික රසායන දෙපාර්තමේන්තුව
දළ රබර් සැකසුම් සංව. හා රසා. ඉං. දෙපාර්තමේන්තුව
ඉලෙක්ට්‍රොනික අලුත්වැඩියා ඒකකය
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව)
ප්‍රවේනි හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව
ශාක විද්‍යා දෙපාර්තමේන්තුව
ශාක ව්‍යාධි හා ක්ෂුද්‍රජීවී විද්‍යා දෙපාර්තමේන්තුව
පාංශු හා ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තුව
ජෛව රසායන හා ශාක කායික විද්‍යා දෙපාර්තමේන්තුව
උපදේශක සේවා දෙපාර්තමේන්තුව
උපයෝගිතා පර්යේෂණ ඒකකය
ජෛවමිතික අංශය
කෘෂි ආර්ථික විද්‍යා ඒකකය
ශුවණ දාශක හා තොරතුරු තාක්ෂණ ඒකකය
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
පාලන දෙපාර්තමේන්තුව
ගිණුම් අංශය
වැඩ අංශය
අධ්‍යක්ෂ කාර්යාලය
වතු දෙපාර්තමේන්තුව
උප මධ්‍යස්ථාන
මොණරාගල
පොල්ගහවෙල
කුරුවිට
පුස්තකාලය

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය

කළමනාකරණ මණ්ඩලය

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයෝ

1. ලක්ෂ්මන් අබේසේකර මහතා, සභාපති, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය (2024.03.28 දක්වා)
2. සරත් චන්ද්‍රසිරි විතාන මහතා, සභාපති, රබර් පර්යේෂණ මණ්ඩලය (2024.05.10 සිට 2024.10.31 දක්වා)
3. ආචාර්ය ප්‍රියන්ත වීරසිංහ මහතා, සභාපති, රබර් පර්යේෂණ මණ්ඩලය (2024.12.06 සිට)
4. ජස්ටින් සෙනෙවිරත්න මහතා, අධ්‍යක්ෂ, ලලාන් රබර් පුද්ගලික සමාගම
5. උදාර ප්‍රේමතිලක මහතා, අධ්‍යක්ෂ වැවිලි (රබර්), කැළණිවැලි වැවිලි සමාගම (2024.06.26 දක්වා)
6. ආචාර්ය ජේ.ඩී.එච්. විජේවර්ධන මහතා, සභාපති, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (2024.02.16 සිට)
7. එච්.එන්.එස්.ටී.කේ. ද සිල්වා මිය, අතිරේක ලේකම් (රබර් හා කුරුඳු සංවර්ධන) කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (2024.06.26 සිට)
8. ප්‍රින්ස් ගුණසේකර මහතා, ප්‍රධාන විධායක නිලධාරී, කෑගල්ල/නමුනුකුල වැවිලි සමාගම
9. පී.ඩී.එල්.පී. සේනාරත්න මිය, අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය (2024.02.16 සිට)
10. මනෝජ් උඩුගම්පොළ මහතා, ප්‍රධාන විධායක නිලධාරී (රබර්), පුස්සැල්ලාව වැවිලි සමාගම/අගලවත්ත වැවිලි සමාගම (2024.06.26 සිට)
11. බී.සී. ගුණසේකර මහතා, නිව්වැටල් වතුයාය (2024.08.26 සිට)

නිල බලයෙන් පත් වූ සාමාජිකයෝ

1. සේනක අලවත්තේගම මහතා, සභාපති, ලංකා වැවිලිකරුවන්ගේ සංගමය
2. සී.සී. මුහන්දිරම්ගේ මහතා, අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව (2024.03.30 සිට)

සහභාගී වූ වෙනත් නිළධාරීන්

1. ආචාර්ය සුසන්ත සිරිවර්ධන මහතා, වැඩබලන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය
2. මණ්ඩල ලේකම්, අකිලා තරිඳුනි මහත්මිය, පරිපාලන නිලධාරී (ලේකම්ගේ වැඩ ආවරණ)

ස්ථාවර කමිටුව

වතු කමිටුව

1. ලක්ෂ්මන් අබේසේකර මහතා, සභාපති, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය
2. ආචාර්ය සුසන්ත සිරිවර්ධන මහතා, වැඩ බලන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය
3. නිස්සංක සෙනෙවිරත්න මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, ලලාන් වැවිලි සමාගම
4. ජගත් හෙට්ටිආරච්චි මහතා, ජ්‍යෙෂ්ඨ කළමනාකරු, අරජ්පොලකන්ද වතුයාය
5. මනෝජ් උඩුගම්පොළ මහතා, ප්‍රධාන විධායක නිලධාරී, පුස්සැල්ලාව වැවිලි සමාගම
6. පී.ඒ. ලක්ෂ්මන් මහතා, ජ්‍යෙෂ්ඨ වතු කළමනාකරු, රබර් පර්යේෂණායතනය
7. බී.එස්.එස්. හේවගේ මහතා, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී, රබර් පර්යේෂණායතනය

විගණන හා කළමනාකරණ කමිටුව

1. පී.ඩී.එල්.පී. සේනාරත්න මිය, අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය (ජනවාරි දක්වා)
2. සී.සී. මුහන්දිරම්ගේ මහතා, අතිරේක ලේකම්, කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (පෙබරවාරි දක්වා)
3. එච්.එන්.එස්.ටී.කේ. ද සිල්වා මිය, අතිරේක ලේකම් (රබර් හා කුරුඳු සංවර්ධන) කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (2024 පෙබරවාරි දක්වා)
4. වී.ඩී. සීතා මිය, ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව (ජූලි දක්වා)
5. ඩබ්ලිව්.වී.ඩී. පෙරේරා මිය, විගණන අධිකාරී, ජාතික විගණන කාර්යාලය
6. කේ.ඒ.සී. ශාමන්ත මහතා, අභ්‍යන්තර විගණක, කෘෂිකර්ම හා වැවිලි අමාත්‍යාංශය

සහභාගිත්වයෙන්

1. ආචාර්ය සුසන්ත සිරිවර්ධන මහතා, වැඩබලන අධ්‍යක්ෂ, රබර් පර්යේෂණායතනය
2. බී.එස්.එස්. හේවගේ මහතා, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී, රබර් පර්යේෂණායතනය
3. එම්.එස්.අයි. සේනාධීර මිය, අභ්‍යන්තර විගණක, රබර් පර්යේෂණායතනය
4. සුසන්ත දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ පරිපාලන නිළධාරී, රබර් පර්යේෂණායතනය
5. අකිලා තරිඳුනි මිය, පරිපාලන නිලධාරීනි, රබර් පර්යේෂණ මණ්ඩලය

විද්‍යාත්මක කමිටුව

<u>ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ සාමාජිකයන්</u>

1. සරත් චන්ද්‍රසිරි විතාන මහතා, සභාපති, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය (2024.05.10 සිට 2024.10.31 දක්වා)
2. ආචාර්ය ප්‍රියන්ත වීරසිංහ මහතා, සභාපති, රබර් පර්යේෂණ මණ්ඩලය (2024.12.06 සිට)
3. ආචාර්ය එස්.පී. විතානගේ මිය, අතිරේක අධ්‍යක්ෂ, ර.ප.ආ.
4. ආචාර්ය ටී.එච්.පී.එස්. ප්‍රනාන්දු මිය, වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව), ර.ප.ආ.
5. ආචාර්ය ඒ.පී. අත්තනායක මිය, වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (තාක්ෂණ), ර.ප.ආ.
6. ආචාර්ය ඊ.එස්. මුණසිංහ මිය, ප්‍රධාන පර්යේෂණ නිලධාරී, උපයෝගීතා පර්යේෂණ ඒකකය, ර.ප.ආ.

7. ආචාර්ය කේ.වී.වී.එස්. කුඩලිගම මිය, ප්‍රධානි, ජෛව රසායන හා කායික විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
8. ආචාර්ය කේ.කේ. ලියනගේ මහතා, ප්‍රධාන පර්යේෂණ නිලධාරී, ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
9. ටී.යූ.කේ. සිල්වා මහතා, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
10. බී.එම්.ඩී.සී. බාලසූරිය මිය, පර්යේෂණ නිලධාරී, උපයෝගීතා පර්යේෂණ ඒකකය, ර.ප.ආ.
11. ඩී.එස්.ඒ. නාකන්දල මිය, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
12. එම්.කේ.ආර්. සිල්වා මිය, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, ශාක ව්‍යාධිවේද හා ක්ෂුද්‍රජීව විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
13. ඩබ්.ඩී.එම්. සම්පත් මහතා, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, රබර් තාක්ෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
14. පී.කේ.කේ.එස්. ගුණරත්න මහතා, ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී, උපදේශක සේවා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
15. ජේ.කේ.එස්. සංකල්ප මහතා, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී, කෘෂි ආර්ථික ඒකකය, ර.ප.ආ.
16. ආචාර්ය නෙලෝමි ගලගෙදර මිය, ප්‍රධාන පර්යේෂණ නිලධාරී, ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
17. කේ. අධිකාරි මහතා, පර්යේෂණ නිලධාරී, දළ රබර් සහ රසායනික විශ්ලේෂණ දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
18. අයි.එච්.කේ. සමරසිංහ මිය, පර්යේෂණ නිලධාරී, බහු අවයවික රසායන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
19. එන්.පී. සුරනි කරුණාරත්න මිය, පර්යේෂණ නිලධාරී, ජෛව රසායන හා කායික විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ
20. පී.ජී.එන්. ඉෂානි මිය, පර්යේෂණ නිලධාරී, කෘෂි ආර්ථික ඒකකය, ර.ප.ආ.
21. ආලෝකා වීරසිංහ මිය, පර්යේෂණ නිලධාරී, රබර් තාක්ෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
22. මංජුල අල්විස් මහතා, පර්යේෂණ නිලධාරී, ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
23. සංගීත් ලියනආරච්චි මහතා, පර්යේෂණ නිලධාරී, පාංශු හා ශාක පෝෂක දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
24. දිල්හාන් රත්නායක මහතා, පර්යේෂණ නිලධාරී, ජෛවමිතික අංශය, ර.ප.ආ.
25. තනුජා වඩුගේ මිය, පර්යේෂණ නිලධාරී, ප්‍රවේණි විද්‍යා හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
26. එච්.වී.ඒ. කෝෂිලා මිය, පර්යේෂණ නිලධාරී, ශාක ව්‍යාධිවේද හා ක්ෂුද්‍රජීව විද්‍යා දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
27. ආර්.ඒ.ඒ.රණවක මිය, පර්යේෂණ නිලධාරී, දළ රබර් හා රසායන විශ්ලේෂණ දෙපාර්තමේන්තුව, ර.ප.ආ.
28. පී.ඒ. ලක්ෂ්මන් මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු (වතු), ර.ප.ආ.

<u>රබර් කර්මාන්තය සහ අනෙකුත් ආයතන නියෝජනය කරන සාමාජිකයෝ</u>

1. මනෝජ් උඩුගම්පොළ මහතා, ප්‍රධාන විධායක නිලධාරී, අගලවත්ත වැවිලි සමාගම, FLC Tower, නො 19, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08
2. එස්. දිසානායක මහතා, සාමාන්‍යාධිකාරී, අගලවත්ත වැවිලි සමාගම, පඹේගම වතුයාය, පරකඩුව
3. කේ. ප්‍රනාන්දු මහතා, සහකාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, අගලවත්ත වැවිලි සමාගම, ක්ලොඩන් වතුයාය, නැබඩ
4. ටීෂාන් දොඩන්වත්ත මහතා, කළමණාකරු, අගලවත්ත වැවිලි සමාගම, දොලොස්වල වතුයාය
5. ලලින්ද ධනංජන මහතා, නියෝජ්‍ය කළමණාකරු, අගලවත්ත වැවිලි සමාගම, ක්ලයිඩ් වතුයාය, තෙබුවන
6. දිමුතු වැකුණගොඩ මහතා, ප්‍රධාන විධායක නිලධාරී, බලංගොඩ වැවිලි සමාගම, රත්නපුර
7. අසිත තිලකරත්න මහතා, වතු අධිකාරී, බලංගොඩ වැවිලි සමාගම, පාම්ගාඩ්න් වතුයාය, රත්නපුර
8. නිලංග බෝගොඩ මහතා, වතු අධිකාරී, බලංගොඩ වැවිලි සමාගම,මහවල වතුයාය
9. ඉංදුසංක රාමනායක මහතා, වතු අධිකාරී, බලංගොඩ වැවිලි සමාගම, මටුවාගල වතුයාය, කිරිඇල්ල
10. ආර්.ඒ. අලහකෝන් මහතා, කළමණාකරු, බලංගොඩ වැවිලි සමාගම, ගලතුර වතුයාය
11. ඩී.කේ. විජේරත්න මහතා, වතු අධිකාරී, බලංගොඩ වැවිලි සමාගම, රඹුක්කන්ද වතුයාය, රත්නපුර
12. අනුෂ පෙරේරා මහතා, ප්‍රධාන විධායක නිලධාරී, හපුගස්තැන්න වැවිලි සමාගම, නො.95A, නම්බපාන, ඉංගිරිය
13. රනිල් කපුගේකියන මහතා, අධ්‍යක්ෂ මෙහෙයුම්, හපුගස්තැන්න වැවිලි සමාගම, නො.95, තැ.පෙ. 02, නම්බපාන, ඉංගංරිය
14. ජෝහාන් රුද්‍රිගු මහතා, ප්‍රධාන විධායක ඉංජිනේරු, හොරණ වැවිලි සමාගම, නො.400, ඩීන්ස් පාර, කොළඹ 10
15. බුද්ධි ගුණසේකර මහතා, අධ්‍යක්ෂ වැවිලි - පහතරට රබර්, හොරණ වැවිලි සමාගම, නො.400, ඩීන්ස් පාර, කොළඹ 10
16. සජිත් ගුණවර්ධන මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, හොරණ වැවිලි සමාගම, ප්‍රොසෙස්ටර් වතුයාය, ගෝවින්න
17. නිශාන්ත මහතා, කළමණාකරු, හොරණ වැවිලි සමාගම, හිල්ස්ටීම් වතුයාය
18. ලක්මාල් කන්දේගම මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකර, හොරණ වැවිලි සමාගම, නිව්වැටල් වතුයාය
19. ඊ.ඒ.එම්.සී.එපිටවල මහතා, භාරකරු, හොරණ වැවිලි සමාගම, හල්වතුර වතුයාය
20. ගයාල් පෙරේරා මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, හොරණ වැවිලි සමාගම, මීරිස්හේන වතුයාය
21. අනුර විරකෝන් මහතා, ප්‍රධාන විධායක නිලධාරී, කැළණිවැලි වැවිලි සමාගම, නො. 400, ඩීන්ස් පාර, කොළඹ10
22. වෛරන් රුබෙරු මහතා, අධ්‍යක්ෂ - වැවිලි රබර්, කැළණිවැලි වැවිලි සමාගම, නො. 400, ඩීන්ස් පාර, කොළඹ10

23. රනිල් ප්‍රනාන්දු මහතා, අධ්‍යක්ෂ - රබර් වෙළඳ හා පාලන, කැළණිවැලි වැවිලි සමාගම, නො. 400, ඩීන්ස් පාර, කොළඹ 10
24. ආර්.එම්.යූ.එස්. ජයසුන්දර මහතා, කළමණාකරු, කැළණිවැලි වැවිලි සමාගම. පනාවත්ත වතුයාය
25. ඩී.ඊ.පී.කේ. වැලිකල මහතා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කළමණාකරු, කැළණිවැලි වැවිලි සමාගම, අදාරපොළ වතුයාය
26. ජගත් රණසිංහ මහතා, නියෝජ්‍ය කළමණාකරු, පුහුණු හා පුහුණු සංවර්ධන, කැළණිවැලි වැවිලි සමාගම, කැළණිය වතුයාය
27. ඩබ්ලිව්.ආර්.ඩබ්ලිව්.එම්.එස්.බී. බුළුමුල්ල මහතා, කළමණාකරු, කැළණිවැලි වැවිලි සමාගම, වී ඔය වතුයාය
28. එස්.එෆ්. ප්‍රනාන්දු මහතා, ප්‍රාදේශීය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, කැළණිවැලි වැවිලි සමාගම, දේවාල කන්ද වතුයාය
29. රෝහණ විජේකෝන් මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, කෑගල්ල වැවිලි සමාගම, නො.65, බණ්ඩාරනායක මාවත, කෑගල්ල
30. පී.එස්.ඒ. ගුණසේකර මහතා, ප්‍රධාන විධායක නිලධාරි, කෑගල්ල වැවිලි සමාගම, නො.65, බණ්ඩාරනායක මාවත, කෑගල්ල
31. බී.එම්.ජේ.ඒ. මුනමලේ මහතා, අධිකාරි, කෑගල්ල වැවිලි සමාගම
32. එම්.ඩබ්ලිව්. ලියනසේකර මහතා, අධිකාරි, කෑගල්ල වැවිලි සමාගම, පාරඹේ වතුයාය, උඳුගොඩ
33. එස්.ඒ.ඒ.පී. ජයතිලක මහතා, අධිකාරි, කෑගල්ල වැවිලි සමාගම, පල්ලේගම වතුයාය, නියඳුරුපොළ
34. ජේ.ආර්. අමුණුපුර මහතා, අධිකාරි, කෑගල්ල වැවිලි සමාගම, අටාන වතුයාය
35. ඒ.ඒ.එම්.ඩී.වී. මැදිවක මහතා, වැඩ බලන වතු අධිකාරි, කෑගල්ල වැවිලි සමාගම, මාදෙණිය වතුයාය
36. බිනේෂ් පනාවල මහතා, ප්‍රධාන විධායක නිලධාරී, නො.11, මීගමුව පාර, පෑළියගොඩ
37. ටෝනි බ්‍රටස් මහතා, ප්‍රාදේශීය කළමණාකරු, කහවත්ත වැවිලි සමාගම, නො.11, මීගමුව පාර, පෑළියගොඩ
38. සී. අමරතුංග මහතා, ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරි, කහවත්ත වැවිලි සමාගම, නො.11, මීගමුව පාර, පෑළියගොඩ
39. ටී.වී. ජයසේකර මහතා, කෘෂි විද්‍යාඥ, කහවත්ත වැවිලි සමාගම, නො.11, මීගමුව පාර, පෑළියගොඩ
40. ඩී. සශික නුවන් ගුණරත්න මහතා, සහකාර කළමණාකරු, කහවත්ත වැවිලි සමාගම, රිල්හේන වතුයාය, පැල්මඩුල්ල
41. අනුරුද්ධ තිලකරත්න මහතා, නියෝජ්‍ය කළමණාකරු, කහවත්ත වැවිලි සමාගම, රිල්හේන වතුයාය
42. සුගත් ගුණරත්න මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, කහවත්ත වැවිලි සමාගම, ඔපාත වතුයාය
43. එම්.ඩී. ජයවර්ධන මහතා, කළමණාකරු, කහවත්ත වැවිලි සමාගම, හුපේ වතුයාය
44. නිශ්ශංක සෙනෙවිරත්න මයා, අධ්‍යක්ෂ - පහතරට, කොටගල වැවිලි සමාගම, අංක 53,1/1, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01
45. උදාර ප්‍රේමතිලක මයා, ප්‍රධාන විධායක නිලධාරී - පහත රට, කොටගල වැවිලි සමාගම, කොටගල වැවිලි සමාගම, අංක 53,1/1, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01

46. ජී. එල්. ටී. ස්වර්ණජිත් මයා, කළමනාකරු, කොටගල වැවිලි සමාගම, අරපොලකන්ද වත්ත, තෙබුවන
47. ඩීෂාන් පෙරේරා මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, කොටගල වැවිලි සමාගම, උස්ක්වැලි වතුයාය, ලත්පඳුර
48. ආර්. තෙන්නකෝන් මයා, ජ්‍යෙෂ්ඨ කළමනාකරු, කොටගල වැවිලි සමාගම, ඩෙල්කිත් වත්ත, බදුරලිය
49. සමන්ත අබේවර්ධන මයා, ජ්‍යෙෂ්ඨ කළමනාකරු, අබේසිංහ මහතා, කළමනාකරු, කොටගල වැවිලි සමාගම, පාදුක්ක වතුයාය, පාදුක්ක
50. ඒ. අබේසිංහ මයා, කළමනාකරු, කොටගල වැවිලි සමාගම, පයාගල වතුයාය, දොඩන්ගොඩ
51. ආර්. බණ්ඩාර මයා, කළමනාකරු, කොටගල වැවිලි සමාගම, ඇඳුරගල වතුයාය, ඉංගිරිය
52. යුගේෂ් වන්නිආරච්චි මයා, කළමනාකරු, කොටගල වැවිලි සමාගම, ගීකියන කන්ද වතුයාය, නෑබඩ
53. හිරාන් උඩුවක මහතා, කළමණාකරු, කොටගල වැවිලි සමාගම, හැඩිගල්ල වතුයාය
54. එච්. එම්. ජයලත් මයා, වැඩබලන කළමනාකරු, කොටගල වැවිලි සමාගම, සොරණ වතුයාය
55. රොෂාන් ඔබේසේකර මයා, කළමණාකරු, කොටගල වැවිලි සමාගම, වෝගන් වතුයාය, මතුගම
56. පී.පී.ඒ.එෆ්. පීරිස් මයා, සාමාන්‍යාධිකාරී, ලාලන් රබර් (පුද්ගලික) සමාගම, අංක 54, කිරුළපන මාවත, කොළඹ 06
57. ඩබ්.එච්.පී. ප්‍රනාන්දු මයා, සමූහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු, ලාලන් රබර් (පුද්ගලික) සමාගම, උඩබාගේ සමූහය, දැරණියගල
58. අමල් කුරුප්පු මයා, වැඩබලන ජ්‍යෙෂ්ඨ කළමනාකරු, ලාලන් රබර් (පුද්ගලික) සමාගම, සපුමල්කන්ද සමූහය, දැරණියගල
59. තරිඳු වික්‍රමසිංහ මයා, ප්‍රධාන විධායක නිලධාරී, මතුරට වැවිලි සමාගම, 12 වන මහළ, නො.19, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08
60. බුද්ධික මැදගම මහතා, ජ්‍යෙෂ්ඨ වතු අධිකාරි ,මතුරට වැවිලි සමාගම, අන්දපාන වතුයාය
61. එල්. එම්. ඒ. සී. බණ්ඩාර මයා, වතු අධිකාරි, මතුරට වැවිලි සමාගම, විල්පිට වතුයාය, අකුරැස්ස
62. එම්.එච්.පී. ගුණරත්න මහතා, වතු අධිකාරි, මතුරට වැවිලි සමාගම, දිද්දෙනිය වතුයාය, මාතර
63. බී. බුළුමුල්ල මහතා, විධායක නිලධාරී, ඇල්පිටිය වැවිලි සමාගම, 09 වන මහළ, එයිටිකන් ස්පෙන්ස් කුළුණ 1, වොක්ෂොල් වීදිය, කොළඹ 2
64. චන්දන ලියදිපිට මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු - පහතරට, ඇල්පිටිය වැවිලි සමාගම, 9 වන මහළ, එයිටිකන් ස්පෙන්ස් කුළුණ 1, වොක්ෂොල් වීදිය, කොළඹ 2
65. හිරන්ජන් බුළුගහපිටිය මහතා, කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, දිවිතුර වතුයාය
66. චානක අත්තනායක මහතා, සහකාර කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, දිවිතුර වතුයාය
67. කසුන් ගනවත්ත මහතා, කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, තල්ගස්වල වතුයාය

68. කෞෂික රාජපක්ෂ මහතා, සහකාර කළමණාකරු, තල්ගස්වල වතුයාය
69. සුධීර හංස මහතා, කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, බෙන්තොට වතුයාය, ඇල්පිටිය
70. ඩබ්ලිව්.ඒ. චමින්ද මහතා, සහකාර කළමනාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, බෙන්තොට වතුයාය
71. නිලාන් දන්දෙණිය මහතා, කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, ඇල්පිටිය වතුයාය
72. ආර්.බී.එස්. ඩග්ලස් මහතා, නියෝජ්‍ය කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, කැටන්දොල වතුයාය
73. කේ.ඒ.ඒ. විමුක්ති මහතා, කළමණාකරු, ඇල්පිටිය වැවිලි සමාගම, ලෙල්වල වතුයාය
74. පී. ද එස්. ඒ. ගුණසේකර මයා, ප්‍රධාන කළමණාකරු, නමුණුකුල වැවිලි සමාගම, අංක 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම
75. ජේ.බී. වීරසේකර මයා, වතු අධිකාරී, නමුණුකුල වැවිලි සමාගම, පල්ලේගොඩ වතුයාය, දර්ගා නගරය
76. ආර්. රණසිංහ මයා, වතු අධිකාරී, නමුණුකුල වැවිලි පීඑල්සී, ඇලදූව වතු යාය, මතුගම
77. කුෂාන් කරුණාතිගක මහතා, අධිකාරී, නමුණුකුල වැවිලි සමාගම, සිට්‍රස් වතුයාය, පාදුක්ක
78. එන්. කළුගල්ල මහතා, වතු අධිකාරී, නමුනුකුල වැවිලි සමාගම, මිරිස්වත්ත වතුයාය, වැලිපැන්න
79. මනෝජ් උඩුගම්පොල මයා, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, පුස්සැල්ලාව වැවිලි සමාගම, 11 වන මහළ, FLC tower, නො. 19, ඩඩ්ලි සේනානායක මාවත, කොලඹ 08
80. වරුණ ගුණරත්න මයා, වතු අධිකාරී, පුස්සැල්ලාව වැවිලි සමාගම, දුරම්පිටිය වත්ත, ගැටහැත්ත
81. අනුෂ වීරකෝන් මයා, වතු අධිකාරී, පුස්සැල්ලාව වැවිලි සමාගම, එල්ස්ටන් වත්ත, පුවක්පිටිය
82. එල්.එම්. අමරතුංග මයා, වතු අධිකාරී, පුස්සැල්ලාව වැවිලි සමාගම, හල්පෙ වත්ත, හංවැල්ල
83. කේ.එම්.සී. ප්‍රසාන් මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, පුස්සැල්ලාව වැවිලි සමාගම, සාලාව වතුයාය
84. චමින්ද ජයලත් මයා, සහකාර සාමාන්‍යාධිකාරී, පුස්සැල්ලාව වැවිලි සමාගම, අයර් වතුයාය
85. එස්.ආර්.අයි. වැලිකල මයා, වතු අධිකාරී, පුස්සැල්ලාව වැවිලි සමාගම, සදර්ලන්ඩ් වතුයාය
86. ඩබ්ලිව්.ජී. ගුණරත්න මහතා, පුස්සැල්ලාව වැවිලි සමාගම, අයර් වතුයාය, පාදුක්ක
87. සුධීර මදනායක මයා, කළමණාකරු, වටවල වැවිලි සමාගම, තලංගහ වත්ත, නාකියාදෙණිය
88. නිලන්ත සෙනෙවිරත්න මයා, කළමණාකරු, වටවල වැවිලි සමාගම, නාකියාදෙණිය වත්ත, නාකියාදෙණිය
89. දිමන්ත සමරසිංහ මයා, ජ්‍යෙෂ්ඨ කළමණාකරු, වටවල වැවිලි සමාගම, හේමදොල වත්ත, උඩුගම
90. ශානක සමරදිවාකර මයා, ප්‍රධාන විධායක නිලධාරී, මල්වත්ත වැලි වැවිලි සමාගම, අංක 280, වේල්ල වීදිය, කොළඹ

91. එම්. ගෞඩියන් මයා, විධායක අධ්‍යක්ෂ - පරිපාලන සහ වතු, මල්වත්ත වැලි වැවිලි සමාගම, අංක 280, වේල්ල වීදිය, කොළඹ 12
92. ආර්.එම්.වී. රත්නායක මහතා, කළමණාකරු සමූහ, මල්වත්ත වැලි වැවිලි සමාගම, මොරලිය වතුයාය, රුවන්වැල්ල
93. ගයා නාකන්දල මහතා, උපදේශක නිලධාරී, 375/26, රත්නපුර පාර, 4 වන විදිය, හෝකන්දර උතුර
94. සරත් සෙනෙවිරත්න මයා, උපදේශක නිලධාරී, සෙනෙවිරත්න සමූහය, ඩී.ජේ. විජේසිරිවර්ධන මාවත, ගල්කිස්ස
95. එන්.එම්. අමරසේකර මයා, උපදේශක නිලධාරී, 37/9, ටෙරන්ස් මාවත, ගල්කිස්ස
96. ජයන්ත පී. මුතුතන්ත්‍රි මයා, උපදේශක නිලධාරී, අංක 4/4, නෙළුම් මාවත, සිරිමල් උයන, ගල්කිස්ස

අර්ථ සාධක අරමුදල් කමිටුව

01. සරත් චන්ද්‍රසිරි විතාන මහතා, සභාපති, රබර් පර්යේෂණ මණ්ඩලය (2024.05.10 සිට 2024.10.31 දක්වා)
02. ආචාර්ය එස්.පී. විතානගේ මිය, වැඩබලන අධ්‍යක්ෂ, ර.ප.ආ. සාමාජික
03. ඩී.එම්.එස්. දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී, ලේකම්
04. බී.එස්.එස්. හේවගේ මහතා, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී, ර.ප.ආ. භාණ්ඩාගාරික
05. ආචාර්ය කේ.වී.වී.එස්. කුඩලිගම මහත්මිය, ප්‍රධානී, ජෛව රසායන හා කායික විද්‍යා දෙපාර්තමේන්තුව, තේරී පත් වූ කමිටු සාමාජික
06. පී.කේ.කේ. එස් ගුණරත්න මහතා, උපදේශක නිලධාරී, තේරී පත් වූ කමිටු සාමාජික
07. ජේ.ඒ.එස්. චන්ද්‍රසිරි මහතා, අත්හදා බැලීම් නිලධාරී, තේරී පත් වූ කමිටු සාමාජික
08. ජේ.ඒ.ඩී. විජයන්ති මිය, කළමණාකරන සහකාර, සාමාජික (2024.10.11 සිට)

සභාපතිතුමාගේ කාර්යාලය සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කාර්යාලය

සභාපති - සරත් චන්ද්‍රසිරි විතාන මහතා (2024.05.10 සිට2024.10.31)
මණ්ඩල ලේකම් - අකිලා තරිඳුනි මිය, පරිපාලන නිලධාරී (මණ්ඩල ලේකම් තනතුරෙහි රාජකාරී කටයුතු ආවරණය කිරීම)
කළමනාකරණ සහකාර - එස්.එස්.ඩී.එස්.ආර්.ඩී.ඒ. විජේරත්න මිය

නීතීඥවරුන්
නීතිපති
නීතිපති දෙපාර්තමේන්තුව
(රජයේ ආයතන)
තැ.පෙ. 502
කොළඹ 12

විගණකවරුන්
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දුව පාර
බත්තරමුල්ල

බැංකුකරුවන්
ලංකා බැංකුව
කෝපරේටි ශාඛාව
75, ජනාධිපති මාවත
කොළඹ 01

ලංකා බැංකුව
අංක 306/72
අගලවත්ත

ඇමතුම් විස්තර

ප්‍රධාන කාර්යාලය සහ විද්‍යාගාර
ඩාර්ටන්ෆීල්ඩ්, අගලවත්ත

දුරකතන:

අධ්‍යක්ෂ	034 - 2248457
අතිරේක අධ්‍යක්ෂ	034 - 2248458
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව විද්‍යා)	034 - 3346118
පොදු දුරකතන	034 - 2247426
	034 - 2247383
	034 - 3349999
	034 - 2248459
ෆැක්ස්:	034 - 2247427
ඊ - මේල්	*dirrri@sltnet.lk*
වෙබ් අඩවිය	www.rrisl.lk

අධ්‍යක්ෂ මණ්ඩල කාර්යාලය සහ රබර් රසායන විද්‍යා හා තාක්ෂණික පරීක්ෂණාගාර
තෙලවල පාර, රත්මලාන

දුරකතන:

සභාපති	011 - 2635019
ෆැක්ස්:	011 - 2633353
අධ්‍යක්ෂ මණ්ඩල කාර්යාලය	011 - 2635142
ෆැක්ස්:	011 - 2605171
අධ්‍යක්ෂ	011 - 2633351
ෆැක්ස්:	011 - 2633351
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (තාක්ෂණ)	011 - 2633352
පොදු දුරකථන	011 - 2635851
	011 - 2635852
ෆැක්ස්:	011 - 2605171
ඊ - මේල්	*dirrub@sltnet.lk*, *rubberreseach@gmail.com*

උප මධ්‍යස්ථාන

නිවිතිගලකැලේ - උප මධ්‍යස්ථානය, මතුගම
ප්‍රවේණි හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව
දුරකතන: 034 - 2247368, 034 - 2247199
ඊ-මේල්: rrigpb@sltnet.lk

කුරුවිට - උප මධ්‍යස්ථානය, රත්නපුර
දුරකතන: 045 - 2262115, 045 - 3460537

පොල්ගහවෙල - උප මධ්‍යස්ථානය, පොල්ගහවෙල
දුරකතන : 037 – 3378191

මොණරාගල - උප මධ්‍යස්ථානය, මොණරාගල
දුරකතන : 055 - 3600707

වෙබ් අඩවිය : www.rrisl.lk

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය
කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය

වැඩබලන අධ්‍යක්ෂ	එස්. සිරිවර්ධන, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), විද්‍යාපති (ඕස්ට්‍රේලියා), දර්ශනශූරි (මැලේසියා) (2024.06.06 දක්වා)
අධ්‍යක්ෂ	එස්. සිරිවර්ධන, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), විද්‍යාපති (ඕස්ට්‍රේලියා), දර්ශනශූරි (මැලේසියා) (2024.06.06 සිට 2024.08.22 දක්වා)
වැඩබලන අතිරේක අධ්‍යක්ෂ	ඩී.ජී. එදිරිසිංහ මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), විද්‍යාපති (ශ්‍රී ලංකා), දර්ශනපති (එක්සත් රාජධානිය), දර්ශනශූරි (ශ්‍රී ලංකා) (2024.06.06 දක්වා)
අතිරේක අධ්‍යක්ෂ	එස්.පී. විතානගේ මිය, කෘෂිකර්ම විද්‍යාවේදී (ශ්‍රී ලංකා), විද්‍යාපති (ඉන්දියා), දර්ශනශූරි (මැලේසියා) (2024.06.07 සිට)
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව විද්‍යා)	එස්.පී. විතානගේ මිය, කෘෂිකර්ම විද්‍යාවේදී (ශ්‍රී ලංකා), විද්‍යාපති (ඉන්දියා), දර්ශනශූරි (මැලේසියා) (2024.06.06 දක්වා)
වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (ජීව විද්‍යා)	ටී.එච්.පී.එස්. ප්‍රනාන්දු මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), දර්ශනපති (ශ්‍රී ලංකා) දර්ශනශූරී (ශ්‍රී ලංකා) (2024.07.02 සිට 2025.03.21 දක්වා)

පර්යේෂණ දෙපාර්තමේන්තු

කෘෂි විද්‍යා දෙපාර්තමේන්තු

ප්‍රවේණි හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව	*(නිවිතිගලකැලේ උප මධ්‍යස්ථානය, මතුගම)*
වැඩ බලන දෙපාර්තමේන්තු ප්‍රධානි	කේ.කේ. ලියනගේ, කෘෂිකර්ම විද්‍යාවේදී (ශ්‍රී ලංකා), දර්ශනපති (ශ්‍රී ලංකා), දර්ශනශූරී (චීනය) (2024.08.02 සිට 2025.03.21 දක්වා)
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී	එන්.එන්. ගලගෙදර මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), විද්‍යාපති (ඇමරිකා එක්සත් ජනපදය), දර්ශනශූරි (ඇමරිකා එක්සත් ජනපදය) (2024.07.26 සිට)
පර්යේෂණ නිලධාරී	ටී.ඩී. වඩුගේ මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
අත්හදා බැලීමේ නිලධාරීන්	ටී.එම්.එස්.කේ. ගුණසේකර එච්.පී. පිරිස්, කෘෂිකර්ම ඩිප්ලෝමා (කුණ්ඩසාලේ) ඒ.කේ. ගමගේ මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
කාර්මික නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන)	බී.ඩබ්ලිව්.ඒ.එන්. බද්දෙවිතාන, කෘෂිකර්ම විද්‍යාවේදී (ශ්‍රීලංකා), දර්ශනපති (ශ්‍රී ලංකා) එන්.එස්. ජයසිංහ මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)

කළමණාකරණ සහකාර (ලිපිකරු)	එස්.ඩී.පී.කේ.එල්. පිරිස් මිය
ශාක විද්‍යා දෙපාර්තමේන්තුව	*(ඩාර්ටන්ෆීල්ඩ්, අගලවත්ත)*
	ටී.යූ.කේ. සිල්වා, කෘෂිකර්ම විද්‍යාවේදී (ශ්‍රී ලංකා), දර්ශනපති (ශ්‍රී ලංකා) දර්ශනශූරි (ශ්‍රී ලංකා) (2024.08.02 සිට 2025.03.21 දක්වා)
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී	ඩී.එස්.ඒ. නාක්න්දල මිය, කෘෂිකර්ම විද්‍යාවේදී (ශ්‍රී ලංකා), දර්ශනශූරි (ශ්‍රී ලංකා)
පර්යේෂණ නිලධාරී	ඩබ්.ඩී.එම්.එන්. ද අල්විස්, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
අත්හදා බැලීමේ නිලධාරීන්	ඩී.එල්.එන් ද සොයිසා
	පී.ඩී.පතිරණ, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	පී.කේ.ඩබ්ලිව්. කරුණාතිලක, කෘෂිකර්ම ඩිප්ලෝමා (රත්නපුර)
කාර්මික නිලධාරීන් (පර්යේෂණ හා සංවර්ධන)	එච්.එම්. සුබසිංහ මෙය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	ආර්.පී.ඩී. ප්‍රියදර්ශන, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	යූ.එන්. උදයකුමාරි මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	ඩබ්ලිව්.එම්.ඩී. වික්‍රමකුමාරි මෙය, කෘෂිකර්ම විද්‍යාවේදී (ශ්‍රී ලංකා), (2024.07.24 දක්වා)
	එච්.එල්.ටී. තාරකා මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
ශාක ව්‍යාධිවේද හා ක්ෂුද්‍රජීවී විද්‍යා දෙපාර්තමේන්තුව	*(ඩාර්ටන්ෆීල්ඩ්, අගලවත්ත)*
දෙපාර්තමේන්තු ප්‍රධානි	ටී.එච්.පී.එස්. ප්‍රනාන්දු මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), දර්ශනපති (ශ්‍රී ලංකා), දර්ශනශූරී (ශ්‍රී ලංකා)
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී	එම්.කේ.ආර්. සිල්වා මිය, කෘෂිකර්ම විද්‍යාවේදී (ශ්‍රී ලංකා), විද්‍යාපති (ශ්‍රී ලංකා), දර්ශනශූරී (ශ්‍රී ලංකා) (2024.04.18 සිට)
පර්යේෂණ නිලධාරී	එච්වී.ඒ.එස්. කෝකිලා මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), දර්ශනපති (ශ්‍රී ලංකා)
අත්හදා බැලීමේ නිලධාරීන්	ඊ.ඒ.ඩී.ඩී. සිරිවර්ධන මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	එස්.සී.පී.විජේරත්න, ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (හාඩ්)
	ඊ.එ.ඩී.එන්. නිශාන්ත, කෘෂිකර්ම ඩිප්ලෝමා (රත්නපුර), BIS Agric, M.AETM(SL)
කාර්මික නිලධාරීන් (පර්යේෂණ හා සංවර්ධන	ඒ.එච්.එම්.එන්.ආර්. අබේරත්න මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), විද්‍යාපති (ශ්‍රී ලංකා)
	ඩී.ඒ.එන්. මල්ලිකාරච්චි මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
කළමණාකරණ සහකාර (ලිපිකරු)	කේ.ඒ.ඩී.වයි. ලංකා මිය, පරිගණක ඩිප්ලෝමා
පාංශු සහ ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තුව	*(ඩාර්ටන්ෆීල්ඩ්, අගලවත්ත)*
පර්යේෂණ නිලධාරීන්	එච්.ඒ.ආර්.කේ. ජයවර්ධන මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), දර්ශනපති (ශ්‍රී ලංකා) (2024.01.12 දක්වා)
	එල්.ඒ.ටී.එස්. ලියනආරච්චි, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)

අත්හදා බැලීමේ නිලධාරීන්	වී.යු. එදිරිමාන්න මෙය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	ඒ.පී. තෙවරප්පෙරුම මෙය
	පී.ඩී.ටී.සී. ගුණතිලක, ජාතික තාක්ෂණ ඩිප්ලෝමා
කාර්මික නිලධාරීන්	එරංගා ද සිල්වා මිය, ජාතික තාක්ෂණ ඩිප්ලෝමා
	ජී.සී. මලවරආරච්චි, උසස් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (හාඩ්)
	ආර්.එම්. බද්දෙවිතාන මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා) (2024.12.20 දක්වා)
	එච්.ඩබ්ලිව්. ගයාන්, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	බී.එම්.කේ. රංගන, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
ජෛව රසායන හා කායික විද්‍යා දෙපාර්තමේන්තුව	*(ඩාර්ටන්හිල්ඩ්, අගලවත්ත)*
ප්‍රධාන පර්යේෂණ නිලධාරී	කේ.වී.වී.එස්. කුඩලිගම මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), දර්ශනපති (ශ්‍රී ලංකා), දර්ශනශූරී (ශ්‍රී ලංකා)
පර්යේෂණ නිලධාරී	එන්.පී.එස්.එන්. කරුණාරත්න මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
අත්හදා බැලීමේ නිලධාරී	එම්.කේ. පෙරේරා, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
කාර්මික නිලධාරීන් (පර්යේෂණ හා සංවර්ධන)	පී.ඩී.ටී.එල්. මධුෂාණි මිය,කෘෂිකර්ම ඩිප්ලෝමා
	එන්.එන්. අබේවර්ධන මෙය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	එල්.ටී.බී.කේ. ප්‍රනාන්දු, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
කළමණාකරණ සහකාර (ලිපිකරු)	එච්.ඒ. මනෝජී එරන්දිකා මිය
උපදේශන සේවා දෙපාර්තමේන්තුව	*(තෙලවල පාර, රත්මලාන)*
ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී	පී.කේ.කේ.එස්. ගුණරත්න, කෘෂිකර්ම විද්‍යාවේදී (ශ්‍රී ලංකා) දර්ශනශූරී (ශ්‍රී ලංකා) (2024.07.26 සිට)
පුහුනු කිරීමේ නිලධාරී	කේ.ජී.පී. මනහාරි මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
රබර් ව්‍යාජ්ත නිලධාරීන්	එස්.එම්.ඒ. සමරකෝන්, කෘෂිකර්ම ඩිප්ලෝමා (කුණ්ඩසාලේ) (2024.04.02 දක්වා)
	ජේ.ඒ.එස්. චන්ද්‍රසිරි (2024.10.23 දක්වා)
	ඩබ්.පී.ජී.ඩී.සී.පී.කේ. සේනානායක, ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (හාඩ්)
	එච්.ජී.එම්.ජී.ජයසිංහ, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	කේ.ඩී.කේ.එල්. සිරිවර්ධන, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	ජී.ආර්. තෙන්නකෝන් මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	ඩී.එස්. දිසානායක, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	පී.වී.එස්. මධුභාෂණ, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	එම්.එන්.පී. ද සිල්වා, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	ඊ.ඩබ්.එස්. රුවන් කුමාර, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	එස්.ඩී. අක්ෂාරා මෙය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	කේ.එච්.ඩී.එම්. ප්‍රේමරත්න මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)

	ආර්.එම්.එස්.එම්. විජේනායක මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	එම්.කේ.එස්.එන්. කුමාර, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	සී.ඒ. සුපුන් ප්‍රසාද්, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
කළමණාකරණ සහකාර (ලිපිකරු)	ආර්.ජී.ඒ.එස්. ධර්මරත්න
	කේ.ජී.පී. සේනාරත්න
	පී. සචිනි ඉෂාරා මිය

තාක්ෂණ දෙපාර්තමේන්තු

රබර් තාක්ෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව	*(තෙලවල පාර, රත්මලාන)*
දෙපාර්තමේන්තු ප්‍රධානි	ඩී.ජී. එදිරිසිංහ මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), විද්‍යාපති (ශ්‍රී ලංකා), දර්ශනපති (එක්සත් රාජධානිය), දර්ශනශූරී (ශ්‍රී ලංකා) (2024.07.19 දක්වා)
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී	ඩබ්.ඩී.එම්. සම්පත්, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), දර්ශනපති (ශ්‍රී ලංකා), දර්ශනශූරී (ශ්‍රී ලංකා)
පර්යේෂණ නිලධාරීන්	යූ.ඒ. වීරසිංහ මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	ඩබ්.එම්.ටී.එන්. වික්‍රමසිංහ, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), විද්‍යාපති (ශ්‍රී ලංකා) (2024.07.31 දක්වා)
කාර්මික නිලධාරීන් (පර්යේෂණ හා සංවර්ධන)	වී.ජී.එම්.ජේ. අබේවර්ධන, ජාතික තාක්ෂණ ඩිප්ලෝමා
	එස්.ජී.පී. භාග්‍යෝවේද මිය, ජාතික තාක්ෂණ ඩිප්ලෝමා
	පී.කේ.අයි.එල්. ජයවර්ධන මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	ඒ.එච්.ඩී.එම්.එන්. ගුණවර්ධන මෙය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	කේ.එන්.ඩී. තිලකරත්න, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
බහු අවයවික රසායන දෙපාර්තමේන්තුව	*(තෙලවල පාර, රත්මලාන)*
පර්යේෂණ නිලධාරී	අයි.එච්.කේ. සමරසිංහ මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), දර්ශනශූරී (ශ්‍රී ලංකා)
අත්හදා බැලීමේ නිලධාරී	එන්. ජයවර්ධන මිය, කෘෂිකර්ම ඩිප්ලෝමා (බිබිලේ)
කාර්මික නිලධාරීන් (පර්යේෂණ හා සංවර්ධන)	එච්.එම්.එච්. ධනුකමලි මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	එස්.වී. රූපසිංහ මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	ඩී.වී.ඩී. මල්ලිකාරච්චි, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	යූ. දිසානායක මිය, උසස් ජාතික ඩිප්ලෝමා, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), විද්‍යාපති (ශ්‍රී ලංකා)

දළ රබර් හා රසායනික විශ්ලේෂණ දෙපාර්තමේන්තුව	*(තෙලවල පාර, රත්මලාන)*
ප්‍රධාන පර්යේෂණ නිලධාරී	ඒ.පී. අත්තනායක මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), දර්ශනශූරී (ශ්‍රී ලංකා)
පර්යේෂණ නිලධාරී	ආර්.ඒ.ඒ.පී. රණවක මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
අත්හදා බැලීමේ නිලධාරී	සී.එස්. ලොකුගේ මිය
කාර්මික නිලධාරීන් (පර්යේෂණ හා සංවර්ධන)	එම්.යු.ඩී.එස්. වීරසිංහ මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	එච්.ඩී.එම්.එස්. විජේවර්ධන, විද්‍යාවේදී (ශ්‍රී ලංකා) (2024.05.03 දක්වා)
	කේ.ඒ.එස්.ටී. කොස්වත්ත, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
දළ රබර් සැකසුම් සංවර්ධන සහ රසායන ඉංජිනේරු දෙපාර්තමේන්තුව	*(තෙලවල පාර, රත්මලාන)*
පර්යේෂණ නිලධාරීන්	ඒ.එම්.එස්.කේ. අධිකාරි, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), දර්ශනපති (ශ්‍රී ලංකා)
	යු.එම්.එස්. ප්‍රියංකා මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), විද්‍යාපති (ශ්‍රී ලංකා) (2024.07.31 දක්වා)
අත්හදා බැලීමේ නිලධාරීන්	වී.සී. රෝහණදීපා මිය
	ඒ.කේ.ඩී.ඩබ්. ප්‍රසාද්
කාර්මික නිලධාරීන් (පර්යේෂණ හා සංවර්ධන)	අයි.ඩී. ඉලේපෙරුම, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
	පී.කේ.එන්.එන්. සඳමාලි මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
කළමණාකරන සහකාර (ලිපිකරු)	එච්.ඒ. ජනනි ලක්ෂිලා මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා) (2024.01.22 දක්වා

අංශ / ඒකක

ජෛවමිතික අංශය	*(ඩාර්ටන්හිල්ඩ්, අගලවත්ත)*
පර්යේෂණ නිලධාරී	ඒ.එම්.ආර්.එස්.ඩී. රත්නායක, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
අත්හදා බැලීමේ නිලධාරී	ඕ.වී. අබේවර්ධන, කෘෂිකර්ම ඩිප්ලෝමා (කුණ්ඩසාලේ)
උපයෝගිතා පර්යේෂණ ඒකකය	*(ඩාර්ටන්හිල්ඩ්, අගලවත්ත)*
ප්‍රධාන පර්යේෂණ නිලධාරී	ඊ.එස්. මුණසිංහ මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), දර්ශනශූරි (ශ්‍රී ලංකා)
කාර්මික නිලධාරීන් (පර්යේෂණ හා සංවර්ධන)	පී.එම්.එම්. ජයතිලක, ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (කෘෂිකර්ම)
	එන්.එම්. පියසේන මිය, කෘෂිකර්ම ඩිප්ලෝමා (කුණ්ඩසාලේ) (2024.01.31 දක්වා)
කළමණාකරන සහකාර	එම්.ඒ. රන්දිමා ශ්‍රීමාලි මිය, ශ්‍රාස්ත්‍රවේදී (ශ්‍රී ලංකා)
කෘෂිකර්ම ආර්ථික ඒකකය	*(ඩාර්ටන්හිල්ඩ්, අගලවත්ත)*
ප්‍රධාන පර්යේෂණ නිලධාරී	ජේ.කේ.එස්. සංකල්ප, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), විද්‍යාපති

	(ශ්‍රී ලංකා), ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය (ශ්‍රී ලංකා)
පර්යේෂණ නිලධාරී	පී.ජී.එන්. ඉෂානි මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
පුස්තකාල හා ප්‍රකාශන ඒකකය	*(ඩාර්ටන්හිල්ඩ්, අගලවත්ත)*
පුස්තකාලයාධිපති සහ ප්‍රකාශන නිලධාරී	එන්.සී.ඩී. විජේසේකර මිය, ශාස්ත්‍රවේදී (ශ්‍රී ලංකා) සමාජීය විද්‍යාපති (ශ්‍රී ලංකා)
අත්හදා බැලීමේ නිලධාරී	ඩී.එම්.එස්. විජේසේකර මෙය, රබර් තාක්ෂණ ඩිප්ලෝමා
ශ්‍රව්‍ය දෘශ්‍ය හා තොරතුරු තාක්ෂණ ඒකකය	*(ඩාර්ටන්හිල්ඩ්, අගලවත්ත)*
ජාල පරිපාලක	එස්.ආර්.ඩි.සි.පී. පීරිස්, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
පරිපාලන දෙපාර්තමේන්තුව (අගලවත්ත)	*(ඩාර්ටන්හිල්ඩ්, අගලවත්ත)*
ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී	ඩි.එම්.එස්. දිසානායක, විද්‍යාවේදී (කළමනාකරණය) (ශ්‍රී ලංකා), මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (ශ්‍රී ලංකා)
කළමණාකරණ සහකාර (ලිපිකරු)	ජේ.ඒ.ඩී. විජයන්ති මිය බී.ඩී. නිරංජලා මිය ඕ.ඩබ්. ඩී. නාමලී උදයන්ති මිය පී.සී. අතුකෝරාල මිය තමෝෂා මුණසිංහ මිය ඕ.ඩබ්.ඩී. නිලුෂා උදයන්ති මිය එම්.එන්.ඩී. පෙරේරා මිය, Dip. In (HRM), Advanced Dip. In CA & SP බී.පී. චන්ද්‍රලතා මිය, ශ්‍රාස්ත්‍රවේදි (ශ්‍රී ලංකා) එම්.ජී.එල්. නිරෝෂනි මිය, ශ්‍රාස්ත්‍රවේදි (ශ්‍රී ලංකා)
දුරකථන ක්‍රියාරීනි	ජේ.ඒ.ඩී.සී. ප්‍රීතිකා මිය
පරිපාලන අංශය (රත්මලාන)	*(නෙලවල පාර, රත්මලාන)*
පරිපාලන නිලධාරී	යූ.කේ. අකිලා තරිඳුනී මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා), PQHRM, HRM
කළමණාකරණ සහකාර (ලිපිකරු)	ඒ.ටී. සේනාරත්න ඒ. ආර්.එම්. ද අල්විස් මිය
අභ්‍යන්තර විගණන ඒකකය	*(ඩාර්ටන්හිල්ඩ්, අගලවත්ත)*
අභ්‍යන්තර විගණක	එම්.එස්.අයි. සේනාධීර මිය, IFA, IPFA, IRCA, LICA, FPFA, PGDM
කළමණාකරණ සහකාර (ලිපිකරු)	ඒ.එම්.ඩබ්.කේ. තිලකරත්න

වැඩ අංශය	*(ඩාර්ටන්හීල්ඩ්, අගලවත්ත)*
නේවාසික ඉංජිනේරු	කේ.ඒ.ඩී.කේ. චතුරංග, විද්‍යාවේදී (ඉංජිනේරු), CEng, MIE (SL) AMSSE (SL), GREEN^{SL} AP (2024.06.14 දක්වා)
ඉංජිනේරු සහකාර	ඩබ්.ඩී.ඩී. ප්‍රසාදිනි මිය, ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (සිවිල්)
ප්‍රවාහන නිලධාරී	යූ.එල්.ඩී.ආර්.එල්. ගුණසිංහ
තාක්ෂණික නිලධාරී (යාන්ත්‍රික)	එච්.ජේ.පී. ප්‍රනාන්දු, ඉංජිනේරු විද්‍යා පිළිබඳ ජාතික ඩිප්ලෝමා
කළමණාකරණ සහකාර (ලිපිකරු)	කේ.කේ.ඩී.කේ.පී. රණවීර මිය
	එම්.එච්.ඩබ්.එච්. කුමාරි මිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
ගිණුම් අංශය	*(ඩාර්ටන්හීල්ඩ්, අගලවත්ත)*
ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී	එස්.එස්. හේවගේ, CPFA (UK), CBA, FPFA
ගණකාධිකාරී	ඩී.එස්.ආර්.එම්.පී. ගුණවර්ධන, MBA (USJ), BSc (FM), FPFA, CBA, MAAT
කළමණාකරණ සහකාර (ගිණුම්)	ජී.පී. කුකුලේවිතාන මිය
කළමණාකරණ සහකාර (ලිපිකරු)	එස්.අයි.කේ. පතිරගේ මිය
	එස්.ඒ. නිලුකා හර්ෂණි මිය
	කේ.කේ.ඩී.වයි.එල්. රණවීර මිය
	කේ.කේ.ටී.එල්. ජයසේකර මිය
	ජේ.ඒ.ජේ.ආර්. ලක්මාල්, B.Com (SL)
	ආර්.පී. තිලිණි මිය
	කේ.ඒ. ඩිලාන් සම්පත්
	එස්.ආර්. සිංහබාහු මිය, ශ්‍රාස්ත්‍රවේදී (ශ්‍රී ලංකා)
	ජී.එන්.කේ. ගුණසේන
	කේ.ඩී. පියුමි හසාරා මිය
මුදල් අයකැමි	ජී.ඒ.ඩී.ඩී. ජයවර්ධන මිය

උප මධ්‍යස්ථාන සහ වතු

කුරුවිට උප මධ්‍යස්ථානය	*(කුරුවිට)*
කළමණාකරණ සහකාර (ලිපිකරු)	ඩී.එස්.ජයසිංහ
පොල්ගහවෙල උප මධ්‍යස්ථානය	*(නාරම්පල වතුයාය, නුංගමුව, යටිගල්ඔළුව)*
පර්යේෂණ නිලධාරී	බී.එම්.ඩී.සී. බාලසූරිය, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
කළමණාකරණ සහකාර (ලිපිකරු)	ඩී.පී.එන්.පී. දිසානායක
මොණරාගල උප මධ්‍යස්ථානය	*(කුඹුක්කන, මොණරාගල)*
ක්ෂේත්‍ර නිලධාරී	වී.ජී.ජී. නිශාන්ත ගුණසීල
	එන්.වී.යූ.එස්. විජිත කුමාර
කළමණාකරණ සහකාර(ලිපිකරු)	ඩී.එම්.පී. සඳුන් කුමාරි මිය
	එම්.එම්. චමත් කුමාර*

ඩාර්ටන්ෆීල්ඩ් වතු සමූහය

ජ්‍යෙෂ්ඨ කළමනාකරු - වතු	පී.ඒ. ලක්ෂ්මන්, විද්‍යාවේදී (ශ්‍රී ලංකා)
කළමණාකරණ සහකාර (ලිපිකරු)	එච්.ඩී.ඩී. අචින්ද
	එම්.ඒ.එන්. සචින් පවින්ද
	ටී.ඩී. හර්ෂ
ක්ෂේත්‍ර නිලධාරී	බී.එම්. සිරිවර්ධන

*කොන්ත්‍රාත් පදනම

සභාපතිතුමාගේ වාර්තාව
ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය

2024 වසර ශ්‍රී ලංකා රබර් කර්මාන්තය සඳහා අභියෝග සහිත වසරක් විය. දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළේ ඇතිවූ වෙනස්කම්, වාණිජ තත්ත්වය, හා කාබන් නියෝජන සහිත තිරසාර කෘෂිකර්ම අවශ්‍යතා හේතුවෙන් රබර් කර්මාන්තය නව මානයකට යොමු විය. එහෙත්, මෙම අභියෝගයන් මත ද, කර්මාන්තය තිරසාර ලෙස වැඩි දියුණු විය.

රබර් නිෂ්පාදනය

2024 වසරේ රබර් නිෂ්පාදනය මිලියන කිලෝග්‍රෑම් 69 ක් ලෙස වාර්තා විය. මේ මගින් 2023 වසරේ මිලියන කිලෝග්‍රෑම් 64 ක ප්‍රමාණයට සාපේක්ෂව ඉහළ යාමක් පෙන්වා දුන්නේය. හෙක්ටයාරයකට අදාළ අස්වැන්න වසරකට කි.ග්‍රෑම් 1214 දක්වා ඉහළ ගොස් තිබීම, කාර්යක්ෂම වගාවක් ලෙස සලකන අතර, කර්මාන්තයේ තරගකාරීත්වය වැඩි කළේය.

2024 වසරේදී දේශීය රබර් නිෂ්පාදනයේ 49% ක් ආවරණය කළේ "Smoked Sheet Rubber" මඟින් වේ. තවද, TSR (Technically Specified Rubber) 18%, Latex Crepe 8%, Scrap Crepe 6%, Sole Crepe 1% දක්වා ඇති අතර, "Latex සහ අනෙකුත් රබර් නිෂ්පාදන" ද ඇතුලත් විය. මෙයින් පැහැදිලි වන්නේ සම්ප්‍රදායික "Smoked Sheet Rubber" තවදුරටත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ නිෂ්පාදනය බවත්, නවීන වෙළඳපොළ අවශ්‍යතා සපුරාලීමට TSR සහ Crepe වර්ගවල වර්ධනය වීම අත්‍යවශ්‍ය බවත්ය.

වෙළඳපොළ සහ ආදායම් තත්ත්වය

2024 වසරේදී මුළු රබර් අපනයන ආදායම රුපියල් මිලියන 302,749 දක්වා වාර්තා විය. නමුත්, 2023 වසර සමඟ සසඳන විට සම්පූර්ණ ආදායම මඳක් අඩුවූ නමුත්, ප්‍රධානතම ඉලක්ක වූයේ තක්සේරු නොකළ වෙළඳපොල සඳහා යවන ලද නිමි රබර් භාණ්ඩයි. රබර් මිල 2024 දී සැලකිය යුතු අගයකින් ඉහළ ගොස් RSS සඳහා කිලෝග්‍රෑමයක මිල රුපියල් 715 දක්වා වැඩි විය. නමුත් නිෂ්පාදන පිරිවැය කිලෝග්‍රෑමයකට රුපියල් 386 දක්වා ඉහළ යාම නිසා, ගොවීන්ට සහ නිෂ්පාදනකරුවන්ට තරඟකාරීත්වය පවත්වාගෙන යාම දැඩි අභියෝගයක් විය. අපගේ රටේ රබර් අපනයන ප්‍රමාණය මිලියන කිලෝග්‍රෑම් 9 පමණක් වූ අතර, රෙදි, ටයර් සහ අවසාන නිෂ්පාදන මගින් ලැබූ ආදායම රුපියල් මිලියන 293,609 ක් දක්වා ඉහළ ගියේය.

අභියෝග සහ අවස්ථා

රබර් වගා භූමියේ 2024 වන විට පරිසර හිතකාමී මෙන්ම තිරසාර ක්‍රමවේද යටතේ වුවද නව වගා සහ නැවත වගා කිරීමේ ප්‍රමාණය සීමිත ප්‍රමාණයකින් සිදු විය. නමුත් දේශීය පරිභෝජනය මිලියන කිලෝග්‍රෑම් 127 දක්වා ඉහළ ගොස් තිබුණි. මෙය රබර් කර්මාන්තය ජාතික කර්මාන්ත හා අලුත් නිෂ්පාදන ව්‍යවසාය සඳහා ඉහළ තත්ත්වයේ අමුද්‍රව්‍යයක් ලෙස ගෙන යාමට හේතු විය. 2024 වර්ෂයේ පරිණත රබර් භූමි ප්‍රමාණය හෙක්ටයාර් 73,000 දක්වා අඩුවී ඇති අතර, නව වගා භූමිය 559 හෙක්ටයාර හා නැවත වගා භූමිය 843 හෙක්ටයාර පමණක් සිදු විය. එය කර්මාන්තයේ තිරසාරභාවය රඳවා ගැනීම තවදුරටත් අභියෝගයක් බව මතු කරයි.

2024 වර්ෂය අපට පැහැදිලි පණිවිඩයක් ලබා දෙයි. එහිදි රබර් කර්මාන්තයේ දිගුකාලීන තිරසාරභාවය සුරැකීම සඳහා නව පාරිසරික හා තාක්ෂණික උපාය මාර්ග යොදා ගැනීම නව ආයෝජකයින්, කම්කරුවන් ආකර්ෂණය, සහ අගය එකතු කළ නිෂ්පාදන වෙත මාරු වීම අත්‍යවශ්‍ය බවයි.

පිළිගැනීම

අනාගතයේදී, ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය, විද්‍යාත්මක නවෝත්පාදන, ගවේෂණ සහ ගුණාත්මක කර්මාන්ත ප්‍රවර්ධනය මගින්, රබර් කර්මාන්තය නැවතත් ජාතික ආර්ථිකයට ප්‍රධාන දායකයකරවීමට සහ ග්‍රෝලීය වෙළඳපොළේ තරඟකාරීභාවය සුරැකීමට අපගේ උපරිම උත්සාහය යොමු කරනු ඇත.

අවසන් වශයෙන්, 2024 වසරේ අපගේ කාර්යයන් සාර්ථකව ඉටු කිරීමට දායක වූ අමාත්‍යාංශය, මණ්ඩල සාමාජිකයින්, සමස්ථ කාර්ය මණ්ඩලය, ගොවීන් සහ සියලුම හවුල්කරුවන්ට, නිෂ්පාදකයන්, අපනයනකරුවන්, හා ගවේෂණ කණ්ඩායම් සියල්ලටම ගෞරවයෙන් ස්තුති කිරීමට කැමැත්තෙමි. ඔවුන්ගේ කැපවීම නිසාම ශ්‍රී ලංකා රබර් කර්මාන්තය තවත් ශක්තිමත් කරමින්, ජාතික ආර්ථිකයේ වැදගත් අංශයක් ලෙස රැඳී සිටීමට හැකිවිය.

ආචාර්ය ප්‍රියන්ත වීරසිංහ
සභාපති
ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය

2024 වසර තුළ දේශීය හා ගෝලීය රබර් කර්මාන්තය මුහුණ දුන් ගැටළු හා අවස්ථාවන් පිළිබඳ විශ්ලේෂණයකින් මෙම වාර්තාව ඇරඹෙන අතර, අභියෝග ජය ගැනීම සඳහා ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන සැලැස්ම සාරාංශගතව දක්වයි. එහිදී එක් එක් පර්යේෂණ අංශ විසින් දායක වීම පැහැදිලි කරන අතර, ඒ සඳහා ආයතනයේ පරිපාලන හා මූල්‍ය සහභාගීත්වය ඉදිරිපත් කරමින් අවසානයේ තවදුරටත් පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් ඉටු කිරීමේදී මුහුණ දෙන අභියෝග සහ ඒවා ජය ගැනීමට ඇති හැකියාව සහ අනාගතයේ සාක්ෂාත් කරගත යුතු අරමුණු පිළිබඳවත් දළ පැහැදිලි කිරීමත් කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්තය

රබර් නිෂ්පාදනය සහ පරිභෝජනය

2024 වර්ෂය පුරා ස්වභාවික රබර් නිෂ්පාදනය කැපී පෙනෙන ලෙස උච්චාවචනය විය. මුළු ස්වභාවික රබර් නිෂ්පාදනය 2024 වසරේදී වාර්ථා වූ මෙට්‍රික් ටොන් 64,444 ට සාපේක්ෂව 7% ක වැඩිවීමකි. එයට හේතුව ලෙස 2024 වසරේ පැවති හිතකර රබර් මිල පෙන්වා දිය හැක. එහිදී අතහැර දැමූ ඉඩම්වල රබර් කැපීමට ගොවීන් දිරිමත්වීම මෙන්ම STaRR ව්‍යාපෘතිය යටතේ වගා කල රබර් ක්ෂේත්‍රවල කැපුම් ආරම්භවීමත් බලපා ඇත.

2024දී දේශීය ස්වභාවික රබර් පරිභෝජනය මෙට්‍රික් ටොන් 127,400 වූ අතර, එයට ආනයනය කරන ලද මෙට්‍රික් ටොන් 67,330 ක් ස්වභාවික රබර් ද අන්තර්ගත වේ. පෙර වර්ෂයට වඩා ස්වභාවික රබර් සඳහා ඉල්ලුම 38% කින් වැඩි වී ඇත.

රබර් අපනයනය හා ආනයනය

ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් RSS සහ ක්‍රේප් රබර් යන ආකාර දෙකම රබර් අපනයනය කරන අතර, එය මුළු අපනයනයෙන් පිළිවෙලින් 29% ක් හා 61% ක් වේ. ඉතිරි ප්‍රමාණය TSR, කේන්ද්‍රපසාරී ස්වභාවික රබර් කිරි සහ අනෙකුත් රබර් වැනි විවිධ වර්ග වලින් අපනයනය කරනු ලබයි. 2024 වසරේ මුළු අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 8633 ක් වූ අතර, එය 2023 වසරේ අපනයන කළ මෙට්‍රික් ටොන් 12,673 කට සාපේක්ෂව සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කරයි.

2024 වසරේ ආනයනය කරන ලද ස්වභාවික රබර් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 67,331 ක් වූ අතර, එය ප්‍රධාන වශයෙන් TSR (44%), RSS (15%) සහ කෙන්ද්‍රපසාරී ස්වභාවික රබර් කිරි සහ අනෙකුත් රබර් කිරි (40%) වැනි විවිධ වර්ග වලින් සිදු කර ඇත. 2023 වසරදී වාර්තා වූ ආනයනික ස්වභාවික රබර් ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 37,295 කට සාපේක්ෂව මෙම වසරේ ආනයනය 80% ක වැඩිවීමක් පෙන්නුම් කර ඇත.

රබර් වගා භූමි ප්‍රමාණය

2023 වසරේදී සමස්ත රබර් වගා භූමි ප්‍රමාණ ලෙස හෙක්ටයාර 98,393 ක් වාර්තා කලද, නව සමීක්ෂණ වාර්තා අනුව 2024 වසරේ එම භූමි ප්‍රමාණය හෙක්ටයාර 84,002 ක් ලෙස දක්වා ඇත. එහිදී කුඩා වතු හිමියන් සතු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 23,970.2 ක තියුණු අඩුවීමක් වාර්තා වන නමුත් ප්‍රාදේශීය වතු සමාගම් විසින් කළමණාකරණය කරන වගා භූමි වල

ප්‍රමාණය හෙක්ටයාර 4,335.8 කින් වැඩි වී ඇත. 2023 වසරේ වගා කිරීම් හෙක්ටයාර 417 ක් වූ අතර, එය 2024 වසරේ හෙක්ටයාර 559.1 දක්වා සුළු වැඩිවීමක් පෙන්නුම් කර ඇත. එහිදී පෙර වසරට වඩා කුඩා වතු හිමියන්ගේ දායකත්වය හෙක්ටයාර 72.1 කින්ද, RPC විසින් හෙක්ටයාර 70 කින්ද වගා කරන ලදී. කෙසේ වෙතත් නැවත රබර් වගා කිරීම 2023 වසරදී හෙක්ටයාර 1,186 ක් වූ අතර, 2024 වසරදී එය හෙක්ටයාර 842.82 දක්වා සැලකිය යුතු අඩුවීමක් පෙන්වීය. එම අඩුවීම කුඩා වතු හිමියන් අතර 23.3% ක සහ RPC වල 31% ක අඩුවීමකි. මෙලෙස නැවත වගා කරන සහ නව වගාව වෙත යොමුවන රබර් භූමි ප්‍රමාණයේ අඩුවීමේ ප්‍රවණතාව ඉදිරියේ රබර් කර්මාන්තයේ තිරසාර බවට සහ ඵලදායීතාව අභියෝගයට ලක් කරයි.

ස්වභාවික රබර් මිල ගණන්

2024 වසරදී සියළුම RSS ශ්‍රේණිවල වාර්ෂික සාමාන්‍ය මිල පෙර වසරට සාපේක්ෂව ඉහළ අගයක පැවතුනි. RSS1 මිල අප්‍රේල් මාසයේ ඇමරිකානු ඩොලර් 2.13 සිට 2.70 දක්වා විචල්‍ය වූ අතර RSS3 මිල ඇමරිකානු ඩොලර් 2.07 සිට 2.38 දක්වා පරාසයක පැවතුනි. එහිදී RSS1 මිල 27% කින්ද RSS3 මිල 29% ක වැඩිවීමක් පෙර වසරට සාපේක්ෂව පෙන්වීය. LCIX රබර් මිල 2024 දී ඇමරිකානු ඩොලර් 2.52 (මාර්තු) සිට ඇමරිකානු ඩොලර් 3.64 (නොවැම්බර්) අතර විචලනය වූ අතර එහි සාමාන්‍ය අගය ඇමරිකානු ඩොලර් 3.04 ක් විය. එය පෙර වසරට වඩා 26% ක වැඩිවීමකි.

දළ රබර් සහ රබර් නිෂ්පාදන වලින් ලබා ගත් අපනයන ආදායම

2024 දී දළ රබර් අපනයන ආදායම පෙර වසරේ රුපියල් බිලියන 9.28 ට සාපේක්ෂව බිලියන 7.83 ක් විය. මෙය පෙර වසරට සාපේක්ෂව රුපියල් බිලියන 1.46 ක හෙවත් 16% ක අඩුවීමකි. පෙර වසරවල මෙන්, RSS සහ Crepe රබර් අපනයනය කරන ලද ප්‍රධාන ස්වභාවික රබර් වර්ග දෙක විය. ශ්‍රී ලංකාව ගෝලීය රබර් වෙළඳපොළේ උසස් තත්ත්වයේ Crepe රබර් නිෂ්පාදනයේ ප්‍රධාන නිෂ්පාදකයෙකු ලෙස පවතී. Crepe රබර් මෙට්‍රික් ටොන් 5,238 ක් සහ RSS රබර් මෙට්‍රික් ටොන් 2,478 ක් අපනයනය කිරීමෙන් පිළිවෙලින් රුපියල් බිලියන 1.55 ක් සහ රුපියල් බිලියන 5.32 ක් උපයා ඇත. අර්ධ සැකසූ රබර් වලින් අපනයන ආදායම 2024 දී රුපියල් බිලියන 1.3ක් ලෙස වාර්තාවී ඇති අතර, 2023 දී එය රුපියල් බිලියන 0.93 ක් විය. රබර් නිෂ්පාදන වලින් ලැබුණු මුළු අපනයන ආදායම රුපියල් බිලියන 294 (ඇමරිකානු ඩොලර් බිලියන 0.97) කි. මෙය ටයර් නිෂ්පාදන, රබර් අත්වැසුම් සහ අනෙකුත් රබර් නිෂ්පාදන පිළිවෙලින් ඇමරිකානු ඩොලර් මිලියන 598, ඇමරිකානු ඩොලර් මිලියන 278 සහ ඇමරිකානු ඩොලර් මිලියන 96 කට අපනයනය කිරීමෙන් උපයා ඇත. ශ්‍රී ලංකාව රබර් අපනයනය කරන ප්‍රධානම රට ඇමරිකා එක්සත් ජනපදය වන අතර, එයට පසුව පිළිවෙලින් ජර්මනිය, බෙල්ජියම, ඉතාලිය සහ බ්‍රසීලය වේ. අපනයන අදායම පෙර වර්ෂයට සාපේක්ෂව පහත වැටීම සුළු අගයකින් අඩු වී ඇති අතර, එය දශක ගණනාවක් තිස්සේ ඇමරිකානු ඩොලර් බිලියන 1 ක් පමණ අගයක පවතී. එය වෙළඳ භාණ්ඩ අංශයේ තුන්වන විශාලතම අපනයන ආදායම් උපයා ගනී. කෙසේ වුවද සංඛ්‍යා ලේඛන තුළින් අපනයන නැඹුරු සාම්ප්‍රදායික නොවන රබර් නිෂ්පාදන තුළින් නව ආයෝජන සහ ගෝලීය වෙළෙඳපොළ තුළ අපගේ කොටස පුළුල් කිරීම සඳහා අවස්ථා ලබා ගැනීම පිළිබඳව අවධානය යොමු කල යුතු බව පෙන්වා දෙයි.

ගෝලීය රබර් කර්මාන්තය පිළිබඳ සමාලෝචනය

ස්වභාවික රබර් සැපයුම

ස්වභාවික රබර් නිෂ්පාදකයින්ගේ සංගමයේ (ANRPC) සංඛ්‍යා ලේඛන වලට අනුව 2024 වසරදී ගෝලීය ස්වභාවික රබර් නිෂ්පාදනය ටොන් 14,855 දහසක් දක්වා ඉහළ ගොස් ඇති අතර, එය පෙර වසරේ අගයට වඩා 4% ක සුළු වැඩිවීමකි. ANRPC සංගමයට අයත් නොවන අයිවරි කොස්ට් වැනි රටවල් ගෝලීය රබර් නිෂ්පාදනයේ වර්ධනයට ප්‍රමුඛ දායකත්වයක් දෙනු ලබයි. වැඩි දියුණු කරන ලද උසස් අස්වැන්න සහිත ක්ලෝන වගාවට එකතු උවද රබර් වගාවට බලපෑ රෝග, දේශගුණ බලපෑම සහ සැලකිය යුතු මට්ටමක නව සහ නැවත වගා භූමි ප්‍රමාණ අඩුවීම මෙම වර්ධනයට බාධා පමුණුවයි. තවදුරටත් ගත් කළ ප්‍රධාන රබර් වගා කරන රටවල පවතින අක්‍රමවත් කාලගුණික රටාවන්, වර්ෂාපතනයේ වැඩිවීම්, අධික සුළං සහ ගංවතුර වැනි තත්වයන් බලාපොරොත්තු වන අස්වැන්න ලබා ගැනීමට බාධාවක් වී ඇත. කෙසේ උවද මෙම අවාසිදායක තත්ව හමුවේ වුවද වර්ෂ ගණනවක් පුරා අඩු මිලක් දැක්වූ රබර් මිලේ හිතකර වැඩිවීම සමඟ අතහැර දමා තිබූ රබර් භූමි නැවත කැපීම ආරම්භ කිරීම 2024 වර්ෂයේ නිෂ්පාදන වැඩිවීමට හේතුවක් වේ.

ස්වභාවික රබර් අස්වැන්න

ස්වභාවික රබර් නිෂ්පාදනය කරන රටවල (ANRPC) මෙම අගය වසරකට හෙක්ටයාරයකට කිලොග්‍රෑම් 727 සිට 1786 දක්වා වෙනස් විය. මෙහිදී වියට්නාමයෙන් ඉහළම අස්වැන්න වාර්තා වූ අතර පිලිපීනය අවම අගය වාර්තා විය. තවද ලංකාවේ එම අගය වසරකට හෙක්ටාරයකට කිලෝග්‍රෑම් 944 ක් ලෙස සටහන් විය.

රබර් වගා භූමි ප්‍රමාණය

ස්වභාවික රබර් නිෂ්පාදනය කරන රටවල සම්පූර්ණ රබර් වගා භූමි ප්‍රමාණය හෙක්ටයාර 12,536 දහසක් වූ අතර, ඉන් 78% ක් කිරි කපන තත්වයේ පවතින වගා භූමි වේ. 2023 වසරදී මෙම අගය හෙක්ටයාර 12,487 දහසක් විය.

ගෝලීය ස්වභාවික රබර් ඉල්ලුම

2024 වසරදී ගෝලීය ස්වභාවික රබර් ඉල්ලුම ටොන් 15,342 දහසක් දක්වා වැඩිවූ අතර, එය පෙර වසරට වඩා 2% ක වැඩිවීමකි. ලෝකයේ වැඩිම ස්වභාවික රබර් පරිභෝජනය කරන රට ලෙස පසුගිය වසර පහ තුලට චීනය පැමිණි අතර, ඔවුන්ගේ පරිභෝජනය 2023 පැවති ටොන් 6,864 දහසක් වූ අගයට සාපේක්ෂව 2024 දී ටොන් 6,986 දක්වා වැඩිවීමක් දැක්විය.

ස්වභාවික රබර් මිල ගෝලීයව විචලනය වන ආකාරය

2011 වසරේ සිට 2018 දක්වා දිර්ඝ කාලයක් රබර් මිලෙහි අඩුවෙන ප්‍රවණතාව තිබූ අතර, 2021 සහ 2022 වසරේ එය නැවත පහළ වැටීමක් සිදු විය. 2024 වසර ආරම්භයේදී කොළඹ RSS3 මිල හා බැංකොක් වල RSS3 මිල සමානව පැවතියද, පසුව එය අඩුවීමක් පෙන්නුම් කරන ලදී. කොට්ටායම් වල RSS4 මිල කොළඹ සහ බැංකොක් අගයට වඩා දිගටම ඉහළ අගයක් වාර්තා කල අතර, එය වසර මැදදී ඉහළ අගයක් වාර්තා කරන ලදී. බැංකොක් වල RSS3හි සාමාන්‍ය වාර්ෂික මිල ඇමරිකානු ඩොලර් 2.38 ක් විය. (ජනවාරි ඇමරිකානු ඩොලර් 1.95 ක් වූ අතර ඉහළම අගය වූ ඇමරිකානු ඩොලර් 2.81 ක් සැප්තැම්බර් මස පෙන්වීය.) කොට්ටායම් වල සාමාන්‍ය වාර්ෂික RSS4 මිල ඇමරිකානු ඩොලර් 2.31 ක් වූ අතර එය අගෝස්තු මසදී ඇමරිකානු ඩොලර් 2.83 ක් වැනි ඉහළ අගයක් ගනු ලැබීය. කොළඹ RSS 3 මිල අවම අගයක් වූ ඇමරිකානු ඩොලර් 2.12 ක් පැවති අතර, එය දිගටම බැංකොක් වල RSS 3 මිලට වඩා අඩුවෙන් පැවතුනි. කොළඹ RSS1 මිල බැංකොක්හි RSS3 ප්‍රවණතාවයට

සමානත්වයක් දැක්වූ අතර, වාර්ෂික සාමාන්‍යය ඇමරිකානු ඩොලර් 2.37 ක පැවතුන අතර, තවද ඉහළම අගය වූ ඇමරිකානු ඩොලර් 2.77 ක් ඔක්තෝම්බර් මස දී පෙන්වීය.

පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්

රබර් වගාවේ වැඩි දියුණු කිරීම සහ තිරසරබව ඇති කිරීම ඉලක්ක කර ගත් පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් වලට මූලික අවධානය යොමු කරන ලදී. වාර්ෂිකව ප්‍රවේණි විද්‍යාත්මකව වැඩි දියුණු කරන ලද දෙමහුම් ප්‍රජනිතයින් නිපදවීම සඳහා විකම් නොවන ජනක ප්ලාස්ම එකතුව දායක කර ගත් අතර, වාණිජ මට්ටමේ ක්ලෝන විශ්ලේෂණ වල දත්ත ලබා ගැනීම කරන ලදී. නියඟයට ඔරොත්තු දෙන ක්ලෝන පදියතලාව ප්‍රදේශයේ කුඩා වතු හිමියන් දෙදෙනෙකු වෙත ලබා දුන් අතර, එම ප්‍රදේශයේ පෙර වර්ෂ වලදී ආරම්භ කරන ලද කුඩා වතු හිමියන්ගේ ක්ෂේත්‍රවල කැපුම් ආරම්භ කරන ලදී. අන්තර් ජාතික බහු පාර්ශ්වීය ක්ලෝන හුවමාරුව හරහා ලංකාවට ලැබුණු ක්ලෝන වල වර්ධනය සහ පාරිසරික අනුගතවීම පිළිබඳ විශ්ලේෂණය කරන ලදී.

තවාන් පැළ වල ගුණත්වය ඉහළ නැංවීම මෙන්ම නිෂ්පාදන පිරිවැය අඩු කර ගැනීම සඳහා ප්‍රශස්ත මට්ටමේ ජල සම්පාදනය කිරීම පිළිබඳව පර්යේෂණ පවත්වන ලදී. රබර් වගාව සහ කිරි කැපීම කෙරෙහි වරින් වර ඇතිවන ගංවතුර තත්වයන් නිසා ඇති වන බලපෑම අධ්‍යයනය කරන ලද අතර, විවිධ ශාක ගණත්වයන් පිළිබඳවද විශ්ලේෂණය කරන ලදී. ක්ෂේත්‍රයට නිකුත් කරන පැලවල ගුණත්වය තහවුරු කිරීම සඳහා රජයේ, ප්‍රාදේශීය වතු සමාගම්වල සහ පෞද්ගලික තවාන් පරීක්ෂා කිරීම සහ පැල සහතික කරන ලදී. රබර් සමඟ අතුරු බෝග වගා මොඩලයන් අධ්‍යයනය කර ගොවීන් වෙත හඳුන්වා දෙන ලදී. එමෙන්ම තිරසාර බව වැඩි කිරීම සඳහා විවිධ කැපුම් ක්‍රම හඳුන්වා දීම ද කරන ලදී. කිරි කැපීමට වර්ෂාවෙන් වෙන බාධාවන් අවම කර ගැනීමට විවිධ ආකාරයේ වැසි ආවරණ පිළිබඳ අධ්‍යයනය කිරීම මෙන්ම ඒ පිළිබඳව ගොවීන් දැනුවත් කිරීමද කරන ලදී. තවදුරටත් ඔවුන් සඳහා අපරිණත වගාවේ නිවැරදි කෘෂි පිළිවෙත් භාවිතය, අතුරු භෝග වගාව, කිරි කැපීම ආදිය ගැන දැනුවත් කිරීම් කරන ලදී. එමෙන්ම යාන්ත්‍රික කිරි කැපීම ගැනද අධ්‍යයනය කරන ලදී.

රබර් වගාව තුළ පැතිර ගිය වළයාකාර පත්‍ර පුල්ලි රෝගය මර්ධනය සඳහා රසායනික සංයෝග මිශ්‍රණයක් වැඩි දියුණු කරන ලද අතර, එම මිශ්‍රණය හඳුන්වා දීමට විශේෂ විද්‍යාත්මක රැස්වීමක් රබර් වගාවේ පාර්ශ්වකරුවන්හට පවත්වන ලදී. එමෙන්ම එම රෝගයට ප්‍රතිරෝධී ඔරොත්තු දෙන රබර් ක්ලෝන හඳුනා ගැනීම කල අතර, RRIC 100, RRISL 2006 සහ RRISL Centennial 4 යන ක්ලෝන රෝගයට ඔරොත්තු දෙන මට්ටමක පවතින බව තහවුරු විය. එමෙන්ම ඒ සඳහා ජපානයේ RIKEN විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතා පර්යේෂණ අරඹන ලදී. තවද රබර් වගාව ආශ්‍රිත රෝග පාලනය පිලිබඳ ගොවීන් දැනුවත් කිරීම් සහ රබර් තවාන් වල පවතින රෝග මර්ධනය පිළිබඳ රජයේ තවාන්වල කාර්ය මණ්ඩලයට පුහුණුවීම් මාලාවක් ලබා දෙන ලදී.

රබර් ඉඩම් මැනීම සහ සිතියම්ගත කිරීම සඳහා ඉහළ මට්ටමේ GPS සහ ඩ්‍රෝන තාක්ෂණය භාවිතය පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. " යාර මිලා " කැට පොහොර රබර් වගාවේ අපරිණත අවධිය සඳහා භාවිතා කිරීමේ හැකියාව සොයා බැලීමට පෞද්ගලික අංශය සමඟ සහයෝගීතා පරීක්ෂණ සාම්ප්‍රදායික මෙන්ම සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල සිදු කරන ලදී. එමෙන්ම පාංශු සාම්පල, කටුපොල් පත්‍ර සාම්පල, පොහොර සාම්පල මෙන්ම කොම්පොස් පොහොර සාම්පල ද විශ්ලේෂණය කර වාර්තා නිකුත් කරන ලදී. ඒ අනුව ක්ෂේත්‍ර වලට විශේෂිත වූ පොහොර නිරදේශ ලබා දීම සිදු කරනු ලැබීය.

රබර් වගාවේ තිරසාරභාවය සහ ඵලදායීතාව ඉහළ නැංවීම අරමුණු කර ගත් පර්යේෂණ හා සංවර්ධන දියත් කරන ලදී. ඵලදායීතාව අඩු නැති ඉඩම් සඳහා මෙහිදී ක්ෂේත්‍රයට විශේෂිත වූ උත්තේජනය කිරීම් ක්‍රම යොදා ගන්නා ලදී. එමෙන්ම නව දියුණු කරන ලද ජලයේ දියවන එතෆෝන් භාවිතය වාණිජ මට්ටමේ අත්හදා බැලීමට පෞද්ගලික අංශය සමඟ සහයෝගීතා පර්යේෂණ සිදු කරන ලදී. එමෙන්ම එමඟින් කිරි කැපීම හා උත්තේජක භාවිතය නිසා ගසට වන ආතතිය මැඩපැවැත්වීමට ඇති හැකියාව පිළිබඳවද පර්යේෂණ කරන ලදී. ක්ලෝන වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියේදී උසස් ක්ලෝන මුල් අවධියේම හඳුනා ගැනීමට රබර් කිරි ආශ්‍රිත පරීක්ෂණ සිදු කරන ලද, අතර එමඟින් නුසුදුසු ක්ලෝන මුල් අවධියේම ඉවත් කිරීමේ හැකියාව ලැබේ. වලයාකාර පත්‍ර රෝගයෙන් රබර් අස්වැන්නට සහ රබර් වල ගුණාත්මකභාවය සිදු විය හැකි බලපෑම අධ්‍යයනය සඳහා පර්යේෂණයක් දියත් කරන ලදී. එමෙන්ම කිරි කැපීමේදි සහ එතෆෝන් භාවිතයෙන් රබර් ගසට සිදුවන පීඩනය අවම කිරීම සහ රබර් වගාවේ තිරසාරභාවය වැඩි දියුණු කිරීම උදෙසා දේශීයව නිෂ්පාදනය කරන ලද එතෆෝන් මිශ්‍රණයක් වැඩි දියුණු කර අත්හදා බලනු ලැබිය.

රබර් වගාකරුවන් වෙත උසස් කෘෂි පිළිවෙත භාවිතය පිළිබඳ දැනුම හා පුහුණුව ලබා දීම සඳහා රබර් ව්‍යාප්ති සේවය තෝරා ගත් කුඩා වතු හිමියන් සමඟ විවිධ ක්‍රමෝපායන් තුළින් දියත් කරන ලදී. එහිදී අතුරු භෝග භාවිතය, වැසි ආවරණ භාවිතය පිළිබඳ මෙන්ම නව තාක්ෂණය රබර් වගාවට යොදා ගැනීම පිළිබඳව අවධාරණය කරන ලදී. මෙහිදි කුඩා වතු හිමියන්, ක්ෂේත්‍ර නිලධාරීන්, වතු සේවකයින් දැනුවත් කරන ලදී. විභිදුම් සත්කාර වැඩ සටහන කුඩා වතු හිමියන් ඉලක්ක කරගත් අතර එහිදි ඵලදායීතාව වැඩි කිරීම පිළිබඳ ඔවුන් දැනුවත් කරන ලදී. අල්ෆා පරම්පරාව සඳහා අස්වනු සහායක කුසලතා වැඩි දියුණු කිරීමට මෙන්ම රබර් භාණ්ඩ නිෂ්පාදනය තුලින් රබර් සඳහා අගය එකතු කිරීමේ හැකියාව වර්ධනය කිරීමට වැඩසටහන් පවත්වන ලදී.

වියළි කලාපයේ රබර් වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන් හා සමගාමීව පවත්වන ලදී. දේශීය රබර් ගොවීන්ගේ කිරි කැපීමේ කුසලතාව ඉහළ නැංවීම සඳහා වැඩසටහන් දියත් කරන ලදී. ක්ෂේත්‍ර වලට විශේෂිත රබර් ආශ්‍රිත වගා ක්‍රම අනුරාධපුර ප්‍රදේශයේ සංවිධානය කළ වැඩසටහනකදී හඳුන්වා දෙනු ලැබිය. නැඟෙනහිර පළාතේ අපරිණත රබර් වගාවන්හි වර්ධනයට ඔවුන්ගේ සමාජ ආර්ථික තත්වය මෙන්ම යොදා ගන්නා කෘෂි පිළිවෙත් වල බලපෑම අධ්‍යයනය කරන ලදී. රබර් වගාවේ තිරසර බව වැඩි දියුණු කිරීම උදෙසා කාබන් වෙළඳපොළ ඉලක්ක කර ගත් ව්‍යාපෘතියක් සඳහා Proclime Lanka (pvt) Ltd සමඟ එකඟතාවට එළඹුණි.

ඉඩම් භාවිතය පිළිබඳ විශ්ලේෂණ ගණනාවක් අධ්‍යයනය කරන ලද අතර, එහිදී ඉඩම් භාවිතය, වෙළඳපොල වෙනස්වීම, සමාජ ආර්ථික සාධකවල බලපෑම සලකනු ලැබිය. ඉඩම් භාවිතය හා ආවරණ (LULC) වර්ගීකරණයන් තාක්ෂණය සහ දුරස්ථ සංවේදන තුළින් ඇගයීමට ලක් කරන ලදී. කුඩා වතු හිමියන්ගේ කිරි කපන දින සහ අස්වැන්න මත වර්ෂාපතනයේ බලපෑම අධ්‍යයනය කිරීම අරඹන ලදී. රබර් වෙළඳපොළ සහ අපනයන ප්‍රවණතා ඇගයීමට අමු රබර් හා නිමි රබර් භාණ්ඩවල වෙළඳපොළ විශ්ලේෂණයක් සිදු කරන ලදී. රබර් වගාව තුළ ආර්ථික ශක්‍යතාව තීරණය කිරීමට රබර් සමඟ ඉහළ සහත්වයක් සහිත අන්නාසි අතුරු භෝගයක් යොදා ගැනිමේදී විශ්ලේෂණය කරන ලදී. කෑගල්ල දිස්ත්‍රික්කයේ රබර් අස්වැන්නේ විචලතාව අධ්‍යයනයට අවකාශීය සිතියමක් (Special Map) සකස් කරන ලදී. ප්‍රදේශීය වැවිලි සමාගම් වල වතු සේවකයින්ගේ ආහාර සුරක්ෂිතතාවය තක්සේරු කිරීම සඳහා අධ්‍යයනයක් කරන ලදී.

රබර් කර්මාන්තය තුළ පවතින නිශ්චිත අවශ්‍යතා සපුරාලීමට සංඛ්‍යානමය ක්‍රම සංවර්ධනය කර වෙනස් කරන ලද අතර, එමඟින් දත්ත විශ්ලේෂණය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් වැඩි දියුණු කරන ලදී. රබර් කර්මාන්තය තුළ කාර්යක්ෂමතාව සහ නවෝත්පාදනය වැඩි දියුණු කිරීම සඳහා image විශ්ලේෂණ තාක්ෂණය යෙදීමට ඇති හැකියාවද අධ්‍යයනය කරන ලදී.

රබර් කර්මාන්තය තුළ කුසලතා සංවර්ධනය කිරීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් ද රබර් කර්මාන්තයට සහය වීම උදෙසා රබර් සාම්පල් විශ්ලේෂණය සිදු කරනු ලැබීය. රබර් කර්මාන්තකරුවන් සහ විශ්වවිද්‍යාල වල ඉල්ලීම පරිදි ක්‍රේප් රබර්, රබර් සංයෝග, භාණ්ඩ හා පොලිතින් සාම්පල විශ්ලේෂණය කර වාර්තා නිකුත් කරන ලදී. ව්‍යවසායකයන් සහ විවිධ දිස්ත්‍රික්ක වලින් පැමිණි කුඩා රබර් වතු හිමියන්ට රබර් භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳව පුහුණුවීම ලබා දෙන ලදී. පාසල් සිසුන් සඳහා ගෘහ මට්ටමින් රබර් භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳව විශේෂිත වැඩමුළුවක් සංවිධානය කරන ලද අතර කොහු නිෂ්පාදකයින් හට ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය පුහුණුව ලබා දෙන ලදී.

රබර් වල වැඩි දියුණු කිරීම හා විශ්ලේෂණයන් පිළිබඳ පර්යේෂණ අඛණ්ඩව පවත්වා ගත් අතර UV ආලෝකය යටතේ කෙන්ද්‍රපසාරී රබර් කිරි සෘජුව ක්ලෝරීනීකරණය කර ක්ලෝරිනීකෘත ස්වභාවික රබර් නිෂ්පාදනය කිරීමේ ක්‍රම පිළබඳ විශ්ලේෂණය කරන ලදි. එයට අමතරව ඉපොක්සි මවුල 5%ක් අඩංගු ඉපොක්සිකරණය කරන ලද අතර, UNR 50 නිෂ්පාදනය අඛණ්ඩව කර ගෙන යනු ලැබීය. රබර් කර්මාන්තකරුවන් සහ අධ්‍යයන ආයතන වලින් ලබා දෙන ලද පොලිමර් සංයෝග සහ රබර් සංයෝග විශ්ලේෂනය කර නිකුත් කරන ලද අතර, එමඟින් එම සංයෝග වල ගතිගුණ වැඩි දියුණු කිරීම සහ රබර් කර්මාන්තයේ ගැටළු වලට විසඳුම් ලබා දෙන ලදී. රබර් සැකසීම සහ තිරසාරභාවය වැඩි දියුණු කිරීම මෙන්ම රබර් ක්ෂේත්‍රයට සහයවීම උදෙසා පුළුල් පර්යේෂණ දියත් කරන ලදී.

පර්යේෂණාගාර වියලි රබර් මට්ටමට රසායනික ආකලන වලින් සිදු වන බලපෑම සහ ක්ෂෙත්‍රයේ රබර් කිරි වලින් මැග්නීසියම් අයන ඉවත් කිරීමට විකල්ප ක්‍රමයක් සංවර්ධනය කරන ලදී. මෙමඟින් F-NRL හි මැග්නීසියම් අඩුවීම භාවිත කළ හැකි කාර්යක්ෂම, තිරසාර, පාරිසරික හානි අඩු ද්‍රාවණයක් හඳුන්වා දීමට හැකිවන ලදී. දළ රබර්, රබර් කිරි සහ රබර් සැකසීමට යොදා ගන්නා රසායන ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂණ සිදු කර සහතික පත්‍ර නිකුත් කරන ලදී. තවද තාක්ෂණික විශේෂඥ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා රබර් කිරි සහ වියලි රබර් සඳහා භාවිතා කළ හැකි පරීක්ෂණ ක්‍රමවේද පිළිබඳව පුහුණු වැඩමුළු පවත්වන ලදී.

ශ්‍රී ලංකා ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානයෙහි "Ecolability Certificatr'' ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික කමිටුව සහ රබර් නිෂ්පාදන සඳහාවූ ශ්‍රී ලංකා රේගු නාමකරණ සහ වර්ගීකරණ කමිටුවට තාක්ෂණික උපදෙස් ලබා දෙන ලදී. රබර් නිෂ්පාදන වල ගුණාත්මකභාවය තහවුරු කිරීම උදෙසා කර්මාන්තවලින් ලබා දුන් සාම්පල විශ්ලේෂණය කර පරීක්ෂණ සහතික පත්‍ර නිකුත් කරන ලදී. රබර් කර්මාන්තයේ පවතින ගැටළු වලට විසඳුම් ලබාදීම උදෙසා රබර් කර්මාන්තශාලා නිරීක්ෂනය සිදු කරන ලදී. මීට අමතරව, රබර් සැකසුම් තාක්ෂණය සහ දළ රබර් නිෂ්පාදනය පිළිබඳ විශේෂිත පුහුණු දෙදින වැඩසටහනක් විශ්වවිද්‍යාල සිසුන් සඳහා සංවිධානය කරන ලදී.

පර්යේෂණ කටයුතු සඳහා පවතින බාධක

2024 වර්ෂය තුළදී කළමණාකාරීත්වය විසින් ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරියෙකු, පර්යේෂණ නිලධාරීන් පස් දෙනෙකු, රබර් ව්‍යාප්ති

නිලධාරීන් පස් දෙනෙකු සහ ප්‍රසම්පාදන නිලධාරියෙකු සාර්ථකව බඳවා ගන්නා ලදී. මෙම පත්වීම් වලට අමතරව 25/2014 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන යටතේ කලින් අවශෝෂණය කර ගත් සේවකයින් 47 දෙනෙකුගේ සේවය නියාමනය කිරීමට ආයතනය සැලකිය යුතු පියවර ගෙන ඇත. 2024 දෙසැම්බර් වන විට අනුමත කාර්ය මණ්ඩලය 460 ක් වන අතර, සැබෑ සේවක සංඛ්‍යාව 285කි. වසර තුළදී සේවකයින් 17 දෙනෙකු සේවයෙන් ඉවත් විය. කෙසේ වෙතත් පර්යේෂණ නිලධාරීන්ගේ දැඩි හිඟය හේතුවෙන් ආයතනයට සිය පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාමේදි සැලකිය යුතු අභියෝගයන්ට මුහුණ දීමට සිදුව ඇත. අනුමත පර්යේෂණ කාර්යය මණ්ඩලය 79 ක් වුවද දැනට සේවයේ නියුතු පර්යේෂණ නිලධාරීන් සිටින්නේ 25 ක් පමණක් වන අතර, පුරප්පාඩු 54 ක් පවති.

මෙයින් අදහස් වන්නේ පර්යේෂණ තනතුරුවලින් 68.35% ක් පුරප්පාඩු වී ඇති බව මෙන්ම, එය ආයතනයේ පර්යේෂණ කාර්යභාරය ඵලදායි ලෙස ඉදිරියට ගෙන යාම සඳහා බරපතල ලෙස බාධා කරන බවයි. පුරප්පාඩු වූ තනතුරුවලින් 15 ක් බඳවා ගැනීමේ ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරීන් සඳහා වන අතර 23 ක් ජ්‍යෙෂ්ඨ මට්ටම්වල ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් සහ ප්‍රධාන පර්යේෂණ නිලධාරීන්ද ඇතුළුව ඇත. පළපුරුදු විද්‍යාඥයින්ගේ මෙම හිඟය පර්යේෂණ අංශ තුළ නායකත්ව හිඟයක්ද ඇති කර ඇත. පර්යේෂණ දෙපාර්තමේන්තු දහයෙන් තුනක් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් මෙහෙයවනු ලබන අතර, ඉතිරි හත මෙහෙයවනු ලබන්නේ ඉහළ මට්ටමේ තීරණ ගැනීම උපායමාර්ගික පර්යේෂණ සැලසුම්කරණය සඳහා අවශ්‍ය අත්දැකීම් සහ විශේෂඥ දැනුම අඩු කණිෂ්ඨ පර්යේෂණ නිලධාරීන් විසිනි. නිපුන ව්‍යක්තිකයින් හිඟය පර්යේෂණ වල ඵලදායීතාව හීන වන අතර, බාහිර අරමුදල් ලබා ගැනීම හා පර්යේෂණ සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව ලබා ගැනීම අපහසු කරයි. එමෙන්ම රබර් කර්මාන්තයේ ඇති තීරණාත්මක බව හා ආයතනයේ ඇති හැකියාවද අඩු කරයි. එබැවින් මෙම තත්වය දිගින් දිගටම පැවතුණහොත් රබර් ක්ෂේත්‍රයේ ඉදිරි පර්යේෂණ ඉලක්ක කරා ළඟාවීම මෙන්ම තාක්ෂණ දියුණුවටද බලපෑම් කරනු ලබයි. අවසානයේ එය දේශීය මෙන්ම ගෝලීය රබර් ක්ෂේත්‍රයේ සංවර්ධනය හීන කරනු ලබයි.

ආචාර්ය සමන්ති විතානගේ
වැඩ බලන අධ්‍යක්ෂ

පර්යේෂණ හා සංවර්ධන ජයග්‍රහණ

වැඩි දියුනු කරන ලද ක්ලෝන නිපදවීම

- අණුක විද්‍යාත්මක පරීක්ෂණ මගින් ආන්තික ප්‍රදේශ සඳහා වඩා සුදුසු ක්ලෝන හයක් (RRISL 2001, RRIC 121, RRISL 2006, RRISL 2005, PB 260, RRISL Centennial 4, RRISL Centennial 3) හඳුනාගෙන ක්ෂේත්‍ර පර්යේෂණ සඳහා යොමු කොට ඇත.
- ආන්තික ප්‍රදේශ සඳහා සුදුසු ක්ලෝන හඳුනා ගැනීම සඳහා සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල අත්හදා බැලීමේ පර්යේෂණ ලෙස වගා කරන ලද ක්ලෝනවල කිරිකැපීම ආරම්භ කරන ලදී.

රබර් වගාව සඳහා අවශ්‍ය කෘෂි පිළිවෙත් දියුණු කිරීම

- වළයාකාර පත්‍ර පතනය සඳහා වඩාත් ක්‍රියාකාරී රසායනික මිශ්‍රණයක් හඳුන්වා දී තිබේ.




- එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) වෙත ඉදිරිපත් කළ "ඵලදායිතාවය ඉහල නැංවීම මඟින් කුඩා පරිමාන රබර් කුඩා වගාකරුවන්ගේ පුනර්ජීවනය" අරමුදල් අනුමත කර ඇත. මෙම තාක්ෂණික සහයෝගීතා වැඩසටහන (Technical Corporation Project) මොනරාගල හා කළුතර දිස්ත්‍රික්කවල කුඩා පරිමාන රබර් වගාකරුවන් 1,000 දෙනෙකුගේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා දායකත්වය දක්වන අතර, ඒ සඳහා රබර් පර්යේෂණ ආයතනය විසින් හඳුන්වා දුන් නවීන නිර්දේශ භාවිතා කෙරේ. වසර දෙකක කාලයක් සඳහා ඇමරිකානු ඩොලර් 200,000 මුදලකට අදාළ මෙම වැඩසටහන, ආරම්භක සමුළුව ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ දී පවත්වන ලදී.
- ජපානයේ රයිකන් විශ්වවිද්‍යාලය සමඟ එක්ව වළයාකාර පත්‍ර පතන රෝග කාරක දිලීර වල අණුක විද්‍යාත්මක පර්යේෂණයක් හා ජෛව විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කරනු ලැබේ.

- රබර් කර්මාන්තශාලා වලින් ඉවතලන අප ජලය භාවිතා කර දියරමය කාබනික පොහොර නිශ්පාදනය සාර්ථකව සිදු කරන ලදී.





- දිගු කාලයක් භාවිතා කළ හැකි දැඩි වර්ෂාවන්ගෙන් කිරි කැපුම් පැනල ආරක්ෂා කර ගත හැකි නවතම වැහි ආවරණයක් සාර්ථකව අත්හදා බැලිනි. තවද, මෙම වැහි ආවරණය රබර් ක්ෂේත්‍රයට හඳුන්වා දීම සඳහා සුදුසු මෝල්ඩ් (mould) සැකසීම පිළිබඳ අධ්‍යයනය කෙරේ.



- රබර් වගාවේ යෙදී සිටින වගාකරුවන්ගේ ආර්ථික තත්වය ඉහළ නැංවීම සඳහා රබර් සමඟ අතුරු බෝග වැවීම සඳහා සුදුසු බෝග අත්හදා බැලීම සිදු කෙරිණි.



ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණයන් නව්‍යකරණය කිරීම හා ව්‍යාප්තිය

- රබර් වගාවන්හී ඵලදායීතාවය පහත වැටී ඇති බැවින් ඒ පිළිබඳව ප්‍රායෝගික ක්‍රියාවලියක් හඳුනාගැනීම පිණිස ක්ෂේත්‍ර මට්ටමින් සාමූහික වැඩපිළිවෙලක් දියත් කරන ලදී. බොහෝ වගාවන් හී ඵලදායීතාවය අඩුවීම අදාළ ස්ථානයට විශේෂිත හේතුවක් බැව් නිරීක්ෂණය විය. වැවිලි අමාත්‍යාංශය රබර් පර්යේෂණ ආයතනය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාළ වතු සමාගම් වලද සහයෝගීත්වයෙන් සිදු කළයුතු බැව් තීරණය විය.







- ලලාන් රබර් පෞද්ගලික ආයතනය, ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය එක්ව ත්‍රයි පාර්ශ්වික අවබෝධතා ගිවිසුමක් හරහා ජාතික පර්යේෂණ සභාවේ NRC PPP 23-22 අරමුදල මඟින් කොම්පෝස්ට් පොහොර නිශ්පාදනය ට රබර් කර්මාන්තශාලා ඝන අපද්‍රව්‍ය යොදාගැනීමේ ශක්‍යතාවය සාර්ථකව අත්හදා බලන ලදී.




- පාංශු ගුණාංග අවකාශීය සිතියම්ගත කිරීම හරහා රබර් වගා කරන බිම් වල කළමණාකරන කලාප හඳුනාගැනීම තාක්ෂණ ක්‍රමය හරහා සාර්ථකව සිදු කරන ලදී.



- "Cyber Extension" සේවාව ස්ථාපිත කිරීම තුළින් රබර් වගාකරුවන්ගේ ක්ෂේත්‍ර ගැටළු විසඳීමට අවස්ථාව ඇති කරන ලදී
- "කිරිතුර අධ්‍යයන කෙන්ද්‍රය" නමින් රබර් වගාව පිළිබඳ අධ්‍යයන කේන්ද්‍රයක් මොනරාගල උප මධ්‍යස්ථානයේ ස්ථාපිත කිරීම තුළින් සම්ප්‍රදායික නොවන රබර් වගා ප්‍රදේශ වල වගාකරුවන්ගේ තාක්ෂණික ගැටළු විසඳීම සඳහා අවස්ථාව ලබා දෙන ලදී.
- "STaPT" ක්‍රමවේදය හඳුන්වා දීම තුළින් වතු අංශයේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී.





- අම්පාර දිස්ත්‍රික්කයේ කුඩා රබර් වතු හිමියන් ශ්‍රීලංකා රබර් පර්යේෂණායතනය විසින් නිකුත් කර ඇති නිර්දේශ අනුගමනය කිරීමේ අනුපාතය හඳුනා ගන්නා ලදී.

රබර් කර්මාන්තය සඳහා තාක්ෂණය නිපදවීම හා ගුණාත්මය තහවුරු කිරීම

- වළයාකාර පත්‍ර පතන රෝගය පාලනය සඳහා හඳුන්වා දී ඇති නව රසායනික මිශ්‍රණය හඳුන්වාදීම සඳහා විශේෂ විද්‍යාත්මක කමිටුවක් පවත්වන ලදී.






- ආචාර්ය ඩබ්.ඩී.එම්. සම්පත් මහතා 2024 කොළඹ Technobiz ආයතනය මඟින් සංවිධානය කරනු ලැබූ, රබර් සතියේදී "ග්‍රෑෆයිට් වායුක්පන්නයන් ඒකාබද්ධ කළ ස්වාභාවික රබර් සංයෝග" පිළිබඳ ආරාධිත කථිකයෙකු ලෙස සහභාගී විය.



- රන්කැටි රබර් මිල්ස් පුද්ගලික සමාගමේ ඉල්ලීමක් අනුව භූමි අලංකරණය සහ ඉදිකිරීම් කටයුතු සඳහා ස්වාභාවික රබර් අත්වැසුම් අපද්‍රව්‍ය භාවිතයෙන් රබර් කුට්ටි සංවර්ධනය කරන ලදී




- ලංකා රබර් ටෝයිස් පුද්ගලික සමාගමේ ඉල්ලීමක් අනුව ස්වාභාවික ෆෝම් රබර් කිරි භාවිතයෙන් සෙල්ලම් භාණ්ඩ නිෂ්පාදනය කරන ලදී.



- සිනමා කර්මාන්තය උදෙසා ශබ්ද අවශෝෂණ යෙදුම් ලෙස කොකෝටෙක් ලංකා පුද්ගලික සමාගමෙහි ඉල්ලීමකට අනුව, ෆෝම් රබර් ආලේපිත කොහු කුට්ටි සංවර්ධනය කරන ලදී.



- කෘත්‍රිම පාදය සහ අවශේෂ අවයවය අතර අතුරු මුහුණත සඳහා ස්වාභාවික ෆෝම් රබර් කිරි ආලේපිත කපු මේස්,සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ඉල්ලීමකට අනුව නිපදවන ලදී.



- සිනමා කර්මාන්තය සඳහා, ලංකා රබර් ටෝයිස් ලංකා පුද්ගලික සමගාමෙහි ඉල්ලීමකට අනුව, ස්වාභාවික ෆෝම් රබර් කිරි සහ සාන්ද්‍ර රබර් ආලේපනය කළ කඩදාසි භාවිතයෙන් පාෂාණ ආකෘති (models of rocks) සංවර්ධනය කරන ලදී.



- කාඩ්බෝඩ් (දෘඩ කඩදාසි) සහ කඩදාසි ආශ්‍රිත යෙදුම් සඳහා ජලය මත පදනම් වූ මැලියම් (water-based adhesive) වර්ගයක්, ව්‍යාපාරිකයෙකුගේ ඉල්ලීමකට අනුව සංවර්ධනය කරන ලදී.



- ඌව පළාතේ අම්පාර, මොණරාගල දිස්ත්‍රික්කයන්හි රබර් ගොවීන්ගේ ගැටළුවලට පිළියමක් ලෙස ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ මොණරාගල උප මධ්‍යස්ථානයේ රබර් කිරි පරීක්ෂණාගාරයක් ස්ථාපිත කිරීම. එමඟින් රබර් කිරි සඳහා සහතික මිලක් ලබා ගැනීමට හැකිවීම.





- රබර් කර්මාන්තකරුවන්ට සපයන සේවාවන් විධිමත් කිරීම සඳහා විද්‍යුත් පරීක්ෂණ සේවාවන් දියත් කිරීම.





- රබර් කිරිවල මැග්නීසියම් ඉවත් කිරීම සඳහා පරිසර හිතකාමී විකල්ප ක්‍රමයක් හඳුන්වාදීම මඟින් එහි ගුණාත්මක බව වැඩිදියුණු කිරීම. මෙම ක්‍රමය මඟින් රසායන ද්‍රව්‍ය භාවිතය අවම වන අතර, එම රසායන ද්‍රව්‍ය නැවත භාවිතා කළ හැක. මේ සඳහා පේටන්ඩ් බලපත්‍ර ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.



- TSR රබර් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය හිඟය පිළිබඳව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමඟ එක්ව ඔවුන්ගේ නිෂ්පාදන ධාරිතාවෙන් 50% අමුද්‍රව්‍ය ආනයනයට කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදී. මෙමඟින් නිෂ්පාදනයට බාධාවක් වූ සැපයුම් ඉල්ලුමේ අසමතුලිතතාවය සමනය වේ.
- අත්තික්කා ශාඛයෙන් උකහා ගත් එන්සයිමයක් යොදා ගනිමින් අඩු ප්‍රෝටීන් වලින් යුත් රබර් කිරි සාර්ථකව සකසන ලදී.

- හිරු එළිය මඟින් ෂීට් රබර් වියලීම සඳහා වියලුම් කුටීරයක් සකස් කරන ලදී (මෙය මොනරාගල, අම්පාර වැනි වියළි කලාපයේ භාවිතයට සුදුසු වේ.



විශේෂ ක්‍රියාකාරකම්

ලෝකයේ පැරණිම රබර් පර්යේෂණ ආයතනයේ වටිනාකම ඉස්මතුවන අයුරින් ආයතනික තේමා ගීතයක් හඳුන්වා දෙන ලදී. මෙම අවස්ථාව කාර්ය මණ්ඩලය මෙන්ම රබර් කර්මාන්තකරුවන් අතර එක්සත්කම මෙන්ම ආඩම්බරය පිළිබඳ හැඟීමක් ඇති කරයි. මෙම ගීතය මඟින් ආයතනයේ මෙහෙවර, දැක්ම සහ උරුමය පිලිඹිඹු කරයි. මෙහි පදරචනය රබර් පර්යේෂණ මණ්ඩලයේ හිටපු සභාපති සරත් චන්ද්‍රසිරි මහතා විසින් සිදුකරන ලද අතර, සංගීත නිර්මාණය කරන ලද්දේ නවරත්න ගමගේ මහතා විසිනි. ගීතය ගායනා කරන ලද්දේ ආයතනික කාර්ය මණ්ඩලය විසිනි.





පර්යේෂණ දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරකම්

ශෂ්‍ය විද්‍යා දෙපාර්තමේන්තු/අංශ/ඒකක

ප්‍රවේණි සහ ශාක අභිජනන දෙපාර්තමේන්තුව

- මව් ශාඛය ලෙස විකිහැම් නොවන ජනක ප්ලාස්ම ක්ලෝන දෙකක් භාවිතා කරමින් වාර්ෂික කෘත්‍රිම පරාගණ ක්‍රියාවලිය නියුවැටිල් වතුයායේ පවත්වන ලදී.
- අස්වනු දර්ශක ගොඩනැගීමේ අරමුණෙන් ඇලදුව වතුයායේ 2009 වසරේ ස්ථාපනය කරන ලද මහ පරිමාන ක්ලෝන අත්හදාබැලීමේ පර්යේෂණ වගාවේ (ECT) වාණිජ මට්ටමේ දත්ත දිනපතා රැස්කරගන්නා ලදී.
- පසුගිය වසරවල ස්ථාපනය කල කුඩා පරිමාණ ක්ලෝන අත්හදාබැලීම් පර්යේෂණ වගා වසර පුරා නඩත්තු කිරීම, ඇගයීම සහ අධීක්ෂණය කිරීම සිදු කරන ලදී.
- නියඟ ආතතිය සඳහා හඳුනාගත් ක්ලෝන භාවිතා කරමින් අතරමැදි කලාපයක් වන පදියතලාවේ කුඩා වතුභූමියන් සඳහා අත්හදාබැලීම සඳහා (SRT) පර්යේෂණ වගා දෙකක් ස්ථාපිත කරන ලදී.
- වියළි කාළගුනික තත්වයන් සඳහා සුදුසු ක්ලෝන ඇගයීම සඳහා සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල ස්ථාපිත ක්ලෝන ඇගයීම් පර්යේෂණ වගා වල කිරි කැපීම ආරම්භ කරන ලදී.
- බහුපාර්ශ්වික ක්ලෝන හුවමාරු වැඩසටහන යටතේ ගලේවත්ත වතුයාය, සහ නියුවැටිල් වතුයායේ ස්ථාපිත කරන ලද විදේශීය ක්ලෝනවල මූලික දත්ත රැස් කිරීම සිදු කරන ලදී.

ශාක විද්‍යා දෙපාර්තමේන්තුව

- ගුණාත්මක සහ අඩු පිරිවැය ළපටි බද්ධ පැළ නිෂ්පාදනය සඳහා සිදු කරනු ලබන පර්යේෂණ සිදු කිරීම.
- ගංවතුරින් රබර් වගාවේ වර්ධනයට හා අස්වැන්නට සිදුවන බලපෑම පිලිබඳ අධ්‍යයනයන් සිදු කිරීම.
- ළපටි බද්ධ පැළ තවාන් සඳහා වැඩිදියුණු කරන ලද ජලසම්පාදන පද්ධති පිළිබඳ අධ්‍යයනයන් සිදු කිරීම.
- පටක රෝපණ තාක්ෂණය භාවිතයෙන් නව රෝපණ ක්‍රම අත්හදා බැලීම.
- විවිධ ශාක සණත්ව රබර් වගාව සඳහා යොදාගත හැකි ආකාර පිළිබඳ දස වසරක අධ්‍යයනයන් සිදු කිරීම.
- රජයේ, වතු සමාගම් වල සහ පෞද්ගලික රබර් පැළ තවාන් පරීක්ෂාව සහ ගුණාත්මක පැළ නිකුත් කිරීම සහතික කිරීම.
- රබර් සමඟ අතුරුබෝග වගා ක්‍රම දියුණු කිරීම පිළිබඳ අධ්‍යයනයන් සිදු කිරීම.
- තිරසාර රබර් වගාවක් සඳහා විවිධ කිරි කැපුම් ක්‍රම පිළිබඳ අධ්‍යයනයන් සිදු කිරීම.
- රබර් වගාවේ අස්වැන්න නෙලීමට වර්ෂාවෙන් සිදුවන දැඩි බලපෑම අවම කිරීම සඳහා නව වැහි ආවරණ ක්‍රම අත්හදා බැලීම.
- රබර් කිරි කැපීම, තවාන් පාලනය, අපරිණත වගාව පැවැත්ම හා අතුරුබෝග වගා ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීම් සිදු කිරීම.
- යාන්ත්‍රික කිරි කැපීම් ක්‍රම පිළිබඳ අධ්‍යයනයන් සිදු කිරීම.



ශාක ව්‍යාධි හා ක්ෂුද්‍රජීවී විද්‍යා දෙපාර්තමේන්තුව

- වළයාකාර පත්‍ර පතනය සඳහා රසායනික ප්‍රතිකාර ක්‍රම ලෙස 'රසායනික මිශ්‍රණ' දෙකක් වඩාත් ක්‍රියාකාරී බව හඳුනා ගන්නා ලදි.
- ඉහත හඳුනා ගැනීම හා ක්ෂේත්‍ර නිරීක්ෂණ හඳුන්වාදීම සඳහා විශේෂ විද්‍යාත්මක කමිටුවක් (Special scientific commtte meeting) පවත්වන ලදි.
- වලයාකාර පත්‍ර පතන රෝගය පාලනය කිරීම සඳහා, පිළියෙළ කරන ලද ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණු වැඩමුළු 4ක්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ එක්ව කළුතර, රත්නපුර, කෑගල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වලදී සිදු කරන ලදි.
- වළයාකාර පත්‍ර පතනය සඳහා වඩාත් ක්‍රියාකාරී බැව්, ඉන්දියාවෙන් වාර්තා වූ කොපර් ඔක්සි ක්ලෝරයිඩ් කෘෂි-තෙල් සහිත මාධ්‍යයේ පරීක්ෂා කරන ලදි.
- වළයාකාර පත්‍ර පතනය සඳහා ඔරොත්තු දෙන රබර් ක්ලෝන හඳුනාගැනීමේ ක්‍රමවේදයට අනුව තරමක් රෝගයට ඔරොත්තු දිය හැකි ක්ලෝන 3ක් හඳුන්වාදෙන ලදි. (RRIC 100, RRISL 2006, CEN4)
- ශාක ව්‍යාධි හා ක්ෂුද්‍රජීවී විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධානී ආචාර්ය සරෝජිනී ප්‍රනාන්දු සහ අත්හදා බැලීමේ නිලධාරිණී ඩිල්ෂාරි සිරිවර්ධන මහත්මිය සම්පත් දායකයින් ලෙස වලයාකාර පත්‍ර පතන රෝගය පාලන ක්‍රම සඳහා සිදු කෙරෙන පුහුණු වැඩසටහනක් සඳහා පිළිපිනයට යාමට ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් අනුග්‍රහය දක්වන ලදි.
- වැඩි දියුණු කළ රෝග පාලන ක්‍රම හඳුන්වාදීම සඳහා පුහුණු වැඩසටහන් 20ක් පවත්වා තිබේ.
- රබර් කිරි මිදවීම සඳහා යොදාගත හැකි වඩාත් ක්‍රියාකාරී බැක්ටීරියාවක් හඳුනාගන්නා ලදි.
- රජයේ තවාන් සඳහා රෝග පාලන ක්‍රම හඳුන්වාදීමට පුහුණු වැඩසටහන් පවත්වන ලදි.
- ලබා ගෙන ඇති නව දැනුම බෙදා හැරීම සඳහා ප්‍රකාශන 6ක් එළි දක්වා ඇත.
- විශ්ව විද්‍යාල සිසුන් 15ක් සඳහා ඔහුන්ගේ අවසාන පර්යේෂණ සඳහා විවිධ පර්යේෂණ සිදු කරන ලදි.

පාංශු හා ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තුව

- දියුණු ගෝලීය භූ ස්ථාපන පද්ධති සහ ඩ්‍රෝන තාක්ෂණය මඟින් ඉඩම් සිතියම් ගතකිරීමට පුහුණු කිරීමේ වැඩමුලුවක් ඩාටන්ෆීල්ඩ් ඇකඩමියේ සහ කෘෂි ආර්ථික අංශයේ සහයෝගයෙන් පවත්වන ලදී.
- යාරා මිලා පොහොර රබර් වගාව සඳහා යෝග්‍යතාවය පරීක්ෂා කිරීම පෞද්ගලික පොදු සබඳතා ගිවිසුමක් යටතේ සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල සිදු කරන ලදී.
- පස් සාම්පල 83 ක්, ඔයිල් පාම් පත්‍ර සාම්පල 62 ක්, පොහොර සාම්පල 100 ක් කොම්පෝස්ට් සාම්පල 6 ක් සහ එයට අදාල විද්‍යාගාර වාර්තා 49 ක් නිකුත් කරන ලද අතර ක්ෂේත්‍ර විශේෂිත පොහොර නිර්දේශ වාර්තා 16 ක් ද නිකුත් කරන ලදී.

ජෛව රසායන හා කායික විද්‍යා දෙපාර්තමේන්තුව

- අඩු හෝ ඌන ඵලදායීතාවයක් සහිත රබර් වගාවන්වල ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා විශේෂ උත්තේජන ප්‍රොටෝකෝල සකස් කරන ලදී.
- රබර් පර්යේෂණ ආයතනය මගින් වැඩිදියුණු කළ එතෆෝන් මිශ්‍රණවල සාක්ෂාත්භාවය තවදුරටත් පරීක්ෂා කිරීම පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වය යටතේ සිදු කරන ලදී.
- ප්‍රශස්ථ නොවන දේශගුණික තත්ත්වයන් යටතේ වගා කිරීමට සුදුසු රබර් ක්ලෝන වර්ගයන් හඳුනාගැනීමේ පර්යේෂණ සිදු කරන ලදී.
- ක්ෂීර කායික විද්‍යාත්මක ලක්ෂණ උපයෝගී කරගනිමින් වඩා හොඳ ප්‍රවේණි දර්ශ හඳුනා ගැනීම සඳහා සුදුසු ප්‍රොටෝකෝලයක් සංවර්ධනය කිරීමට පර්යේෂණ සිදු කරන ලදී.
- CLSD රෝගය ගස්වල ක්ෂීර කායික විද්‍යාත්මක ලක්ෂණ සහ ඵලදාව කෙරෙහි දක්වන බලපෑම් හඳුනාගැනීමේ පර්යේෂණ ආරම්භ කරන ලදී.
- කිරි කැපීමේදී හා උත්තේජක භාවිතයේදී ඇතිවන ආතතිය අඩු කිරීම සඳහා දේශීයව නිපදවූ එතෆෝන් මිශ්‍රණය වැඩිදියුණු කිරීමට පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ආරම්භ කරන ලදී.

උපදේශක සේවා දෙපාර්තමේන්තුව

- සාම්ප්‍රදායික රබර් වගා කරන ප්‍රදේශ වල ව්‍යාප්ති සේවයේ උපාය මාර්ගික ගොවි සහභාගීත්ව ප්‍රවේශ යටතේ, රබර් පර්යේෂණායතනයේ නිර්දේශයන් අනුකූලව අපරිනත රබර් වගා 40 ක්, පරිනත රබර් වගා 42 ක් සංවර්ධනය කරන ලදී. එක් දින වියළුම් කුටීරය සමඟ ෂීට් රබර් සැකසූ මධ්‍යස්ථානයක් ඉදි කිරීම සහ ප්‍රමිතයෙන් තොර රබර් සැකසුම් මධ්‍යස්ථාන 14 ක් තාක්ෂණික වශයෙන් පුනරුත්තාපනය කරන ලදී.
- කුඩා රබර් වතු 21 ක වැඟි ආවරණ ආදර්ශනද, කුඩා රබර් වතු 08 ක අතුරු බෝග ආදර්ශන ද ස්ථාපනය කරන ලදී.
- කුඩා රබර් වතු හිමියන්ගේ ඉල්ලීම පරිදි තාක්ෂණික භාවිතයේ ගැටළු විසඳීම සඳහා තාක්ෂණික උපදේශක සේවාවන් 991 ක් සිදු කරන ලදී.
- වතු අංශයේ රබර් කිරි අස්වනු සහයකයින් හතලිස් දෙදෙනෙක් සඳහා කිරි කැපුම් කිර්දේශ පිළිබඳව ප්‍රායෝගික පුහුණු වැඩමුළු දෙකක් පවක් වන ලදී.
- කුඩා රබර්වතු හිමියන් 82 ක් හා මධ්‍ය පරිමාණ වගාකරුවන් 55 ක් සඳහා රබර් වගාව පිළිබඳව ප්‍රායෝගික වඩමුළු 05 ක් පවත්වන ලදී.
- වතු කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා වතු කම්කරුවන් 607 ක් සඳහා වැසි ආවරණ සවිකිරීම හා රබර් වගා නිර්දේශ පිළිබඳව ප්‍රායෝගික වැඩමුළු 32ක් පවත්වන ලදී.

- රබර් ඵලදායිතාවය ඉහල නැංවීමේ අරමුණින් කුඩා රබර් වතු 27 ක් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා ඒවායේ ගැටළු නිරාකරණය කිරීම උදෙසා "විහිදුම් සත්කාර" වැඩ සටහන් පවත්වන ලදී.´
- විවිධ ආයතන විසින් සංවිධානය කරන ලද එක්දින පුහුණු වැඩසටහන් 16 ක් සඳහා සම්පත් දායකත්වය ලෙස සහභාගි වී ඇත.
- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ "රබර් මහ සැලැස්ම" යටතේ, රබර් පර්යේෂණායතනයහි ඩාර්ටන්ෆීල්ඩ්, කුරුවිට, පොල්ගහවෙල සහ මොනරාගල උප මධ්‍යස්ථාන වල රබර් අස්වනු නෙලීමේ සහයකයින්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා විශේෂ නියමු ව්‍යාපෘතිය යටතේ වැඩසටහන් 4 ක් තුළින් රබර් කිරි අස්වනු සහයකයින් 89 දෙනෙකු සවිබල ගන්වන ලදී.
- රබර් ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ ප්‍රායෝගික පුහුණු වැඩ සටහනක් "Alpha Generation" for Natural Rubber - (G4NR) නමින් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 63ක් ඉලක්ක කොට පවත්වන ලදී.



- රබර් ඵලදායිතාවය ඉහල නැංවීමේ අරමුණින් කුඩා රබර් වතු 27 ක් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා ඒවායේ ගැටළු නිරාකරණය කිරීම උදෙසා "විහිදුම් සත්කාර" වැඩ සටහන් පවත්වන ලදී.´
- විවිධ ආයතන විසින් සංවිධානය කරන ලද එක්දින පුහුණු වැඩසටහන් 16 ක් සඳහා සම්පත් දායකත්වය ලෙස සහභාගි වී ඇත.
- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ "රබර් මහ සැලැස්ම" යටතේ, රබර් පර්යේෂණායතනයහි ඩාර්ටන්ෆීල්ඩ්, කුරුවිට, පොල්ගහවෙල සහ මොනරාගල උප මධ්‍යස්ථාන වල රබර් අස්වනු නෙලීමේ සහයකයින්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා විශේෂ නියමු ව්‍යාපෘතිය යටතේ වැඩසටහන් 4 ක් තුළින් රබර් කිරි අස්වනු සහයකයින් 89 දෙනෙකු සවිබල ගන්වන ලදී.

ජෛවමිතික අංශය

- රබර් අංශයේ අවශ්‍යතාවලට සරිලන පරිදි සංඛ්‍යානමය ක්‍රම සංවර්ධනය කිරීම සහ වෙනස් කිරීම් සිදු කරන ලදී.
- රබර් කර්මාන්තයේ රූප සැකසුම් යෙදුම් (image processing applications) කෙරෙහි අවධාරණය කරමින් නව අධ්‍යයනයන් ආරම්භ කරන ලදී.

උපයෝගිතා පර්යේෂණ ඒකකය

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොවීන් සඳහා වියළි කළාපීය රබර් වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවිලච්චිය සහ මිහින්තලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි නව රබර් වගා ස්ථාපනය කිරීමේ යෝග්‍යතාව සෙවීම සඳහා ශක්‍යතා අධ්‍යයන සිදු කරන ලදී.
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැහෙනහිර නුවර ගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොවි සහභාගිත්ව උපයෝගිතා පර්යේෂණ නියැදියක් ස්ථාපනය කරන ලදී.



- අනුරාධපුර දිස්ත්‍රික්කයේ රබර් ගොවීන් උදෙසා අස්වනු නෙලීමේ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.



- අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එම ප්‍රදේශයට විශේෂ වූ රබර් ආශ්‍රිත ආදර්ශන වගාවක් ස්ථාපනය කරන ලදී.
- නැහෙනහිර පළාතේ අපරිණත රබර් වගාවන්හි ඌන වර්ධනය සඳහා බලපාන සමාජ-ආර්ථික හා ශෂ්‍ය විද්‍යාත්මක හේතු තක්සේරු කරන ලදී.
- කාබන් අලෙවි කිරීමේ ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදුකිරීම අරමුණු කරගනිමින් Proclime Lanka (Pvt) Ltd සමග ගිවිසුම්ගත වන ලදී.

කෘෂි ආර්ථික විද්‍යා අංශය

- චන්ද්‍රිකා ඡායාරූප සහ නූතන විශ්ලේෂණ ක්‍රම (Machine Learning) භාවිතා කිරීම හරහා කෑගල්ල දිස්ත්‍රික්කයේ භූමි පරිහරණ සහ භූමි ආවරණ රටාවන්වල වෙනස්වීම් සහ ප්‍රවණතා අධ්‍යනය කරන ලදී

- කළුතර, රත්නපුර සහ කෑගල්ල ප්‍රදේශවල කුඩා වතු හිමියන්ගේ රබර් කිරි අස්වැන්නට සහ කිරි අස්වැන්න ලබා ගන්නා දින ගණනට වර්ෂාපතනයෙන් වන බලපෑම තක්සේරු කිරීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කරන ලදී.
- අමු රබර් සහ නිමි රබර් නිෂ්පාදන සඳහා වෙළඳපොළ විශ්ලේෂණයක් සිදු කරන ලදී.
- ශාක විද්‍යා දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් රබර් සමඟ අතරු භෝගයක් ලෙස වගා කරන ලද ඉහළ ඝනත්ව අන්නාසි පද්ධති පිළිබඳ මූල්‍ය තක්සේරුවක් සිදු කරන ලදී.
- කෑගල්ල දිස්ත්‍රික්කයේ රබර් අස්වැන්නේ විචල්‍යතාවය සිතියම් ගත කරන ලදී.
- කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය වැවිලි සමාගම්වල සේවයෙහි නිරත වන වතු සේවකයින්ගේ ආහාර අනාරක්ෂිතභාවය පිළිබඳ අධ්‍යයනයක් ආරම්භ කරන ලදී.

පුස්තකාලය හා ප්‍රකාශන ඒකකය

- ආයතනික ප්‍රකාශන එනම්, ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ රබර් පුවත් වෙළුම 36(2024), වාර්ෂික වාර්තාව 2023 ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ නිල වෙබ් අඩවියට උඩුගත කරන ලදී.
- පුස්තකාල පොත් එකතුව 6269 දක්වා ඉහළ නංවන ලදී.
- හුවමාරු පදනම මත විද්‍යාත්මක සඟරා 20 ක් ලබා ගන්නා ලදී.
- පුස්තකාල පොත් එකතුව කෘමීන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා පුස්තකාලයට ප්‍රවේශ වන පරිශ්‍රය අලුත්වැඩියා කරන ලදී.

ශ්‍රව්‍ය දෘශ්‍ය හා තොරතුරු තාක්ෂණ ඒකකය

- ප්‍රාදේශීය සරි ජාලය (LAN), අතථ්‍ය ප්‍රාදේශීය සරි ජාලය (VLAN), සහ විද්‍යුත් තැපැල් සේවාදායකය පරිපාලනය කිරීමේ කටයුතු සිදු කරන ලදී.
- පරිගණක සහ පර්යන්ත, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ, ඇඟිලි සලකුණු යන්ත්‍ර, දුරකථන පද්ධති සහ සර්ජ් ආරක්ෂණ පද්ධතිය නඩත්තු කිරීම අදාළ සේවා සපයන්නන්ගේ සහය ඇතිව වසර පුරා සිදු කරන ලදී.
- ආයතනික නිල වෙබ් අඩවිය (www.rrisl.gov.lk) සහ නිල ෆේස්බුක් පිටුව (www.facebook.com/RubberResearchInstitute) පිටුව යාවත්කාලීන කිරීමේ කටයුතු වසර මුළුල්ලේම සිදු කරන ලදී

රබර් තාක්ෂණ දෙපාර්තමේන්තු

රබර් තාක්ෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව

- රබර් කර්මාන්තකරුවන්ගේ සහ රාජ්‍ය විශ්වවිද්‍යාල වල ඉල්ලීම් අනුව, ක්‍රේප් රබර් 88ක්, රබර් සංයෝග 647ක්, රබර් නිෂ්පාදන 118ක් සහ පොලිතින් නියැදි පරීක්ෂණ 36ක් සිදුකර වාර්තා නිකුත් කරන ලදී.
- රටේ විවිධ දිස්ත්‍රික්ක වල සිට පැමිණි ව්‍යාපාරිකයින් සහ කුඩා පරිමාණ රබර් වගාකරුවන් 67 දෙනෙකුට ඔවුන්ගේ ඉල්ලීම අනුව, රත්මලානෙහි පිහිටි ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ (RRISL) "රබර් නිෂ්පාදනයන් "පිළිබඳ පුහුණු කිරීමක් සිදු කරන ලදී.

- උපදේශක සේවා දෙපාර්තමේන්තුව සහා රබර් තාක්ෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව එක්ව රුවන්වැල්ල, තල්දූව මධ්‍ය මහා විද්‍යාලයේ සිසුන් 63 දෙනෙකු සඳහා "ගෘහ මට්ටමින් රබර් නිෂ්පාදන නිෂ්පාදනය" පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.



- කහපොළ ප්‍රදේශයෙන් පැමිණි කොහු ආශ්‍රිත නිෂ්පාදකයින් 16 දෙනෙකුගේ ඉල්ලීමක් මත, ඔවුන්ට "රබර් මිශ්‍රිත කොහු මෙට්ට නිෂ්පාදනය පිළිබඳ පුහුණුවක් "සෞභාග්‍ය නිෂ්පාදන ගම්මානය" කහපොල සහ ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය, රත්මලාන යන ස්ථානයන්හිදී සිදු කරන ලදී.



- ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ (NIPM) සිසුන් 12 දෙනෙකු උදෙසා, ‘‘රබර් මත පදනම් වූ නිෂ්පාදනය’’පිළිබඳ වැඩමුළුවක් ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය, රත්මලාන පරිශ්‍රයේදී පවත්වන ලදී.
- රටේ විවිධ දිස්ත්‍රික්ක වලින් පැමිණි තරුණ ව්‍යාපාරිකයින් සඳහා ‘‘රබර් නිෂ්පාදනයන්’’ පිළිබඳ එක්දින පුහුණු වැඩසටහනක්, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය, රත්මලාන පරිශ්‍රයේදී පවත්වන ලදී.



බහු අවයවික රසායනික දෙපාර්තමේන්තුව

- UV ආලෝකය යටතේ කේන්ද්‍රාපසාරී රබර් කිරි සෘජුවම ක්ලෝරීනීකරණය කිරීම හරහා ක්ලෝරිනීකෘත ස්වාභාවික රබර් නිපදවීමේ ක්‍රමයක් විමර්ශනය කරන ලදී.
- ඉපොක්සි අන්තර්ගතය මවුල 5% වන ලෙස ඉපොක්සිකරණය කළ ස්වාභාවික රබර් රසායනාගාර මට්ටමින් සාර්ථකව සංස්ලේෂණය කරන ලද අතර, ENR 50 සංස්ලේෂණය කිරීමේ අත්හදා බැලීම් වැඩදුරටත් පවත්වන ලදි.
- කර්මාන්ත අංශයෙන් සහ විශ්වවිද්‍යාලවලින් ලබාදුන් බහුඅවයවික ද්‍රව්‍ය සහ සංයෝග සාම්පල 674 ක් ෆූරියර් ට්‍රාන්ස්ෆෝම් අධෝරක්ත (FTIR) වර්ණාවලිය සහ තාප ගුරුත්වමිතික විශ්ලේශකය (TGA) මඟින් විශ්ලේෂණය කරන ලද අතර ඒවායේ ප්‍රතිඵල පදනම් කොට ගෙන අවශ්‍ය අවස්තාවලදී කර්මාන්තකරුවන්ට අදාළ උපදෙස් ලබා දෙන ලදි.

දළ රබර් හා රසායන විශ්ලේෂණ දෙපාර්තමේන්තුව

- එක් කරනු ලබන රසායන ද්‍රව්‍ය ප්‍රමාණය මත වියළි රබර් ප්‍රමාණය වෙනස්වන්නේ දැයි සෙවීමට පර්යේෂණයක් සිදුකරන ලද අතර, රබර් කිරිවල ගුණාත්මක බව පවත්වාගැනීමට 10% ඇමෝනියා වඩා උචිත බව තහවුරු විය. මෙමඟින් රබර් කිරි සුරක්ෂා කිරීම උචිත ඇමෝනියා සාන්ද්‍රණය පිළිබඳ රබර් නිෂ්පාදකයන්ට මග පෙන්වීමක් සිදු කෙරේ.
- රබර් කිරිවල ඇති මැග්නීසියම් ඉවත් කිරීම සඳහා විකල්ප ක්‍රමවේදයක් හඳුනාගැනීමට පර්යේෂණයක් සිදු කරන ලදී. එහිදි පරිසර හිතකාමී උචිත ක්‍රමවේදයක් හඳුනා ගන්නා ලදී.
- Pesta දිලීරය මඟින් සෑදෙන පත්‍ර පතන රෝගය මඟින් රබර් කිරි හා වියළි රබර වල ගුණාත්මකභාවයට හානියක් සිදුවන්නේදැයි පරීක්ෂා කිරීමට පර්යේෂණයක් සිදුකරන ලදී.
- රබර් කර්මාන්තකරුවන් ලබාදෙන වියළි රබර් සාම්පල 1770, රබර් කිරි සාම්පල 240 හා රබර් නිෂ්පාදනයට යොදා ගන්නා රසායනික ද්‍රව්‍ය සාම්පල 619 සඳහා විශේෂණ සේවාව ලබා දෙන ලදී. එමඟින් විශේෂ සහතික නිකුත් කිරීම මඟින් ආයතනයට රු.3,203,009.00 මුදලක් උපයන ලදී.
- විශ්වවිද්‍යාල සිසුන්, රබර් කර්මාන්තකරුවන් සඳහා රබර් කිරි හා වියළි රබර් විශ්ලේෂණය පිළිබඳ පුහුණු වැඩමුළු 8 ක් පවත්වන ලදී.



ලියා ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේදී පැවැත්වූ පුහුණු වැඩසටහන

- ජපානයේ නාරාහි පැවැත්වූ ISO TC/45 කමිටු රැස්වීම සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් තාක්ෂණික විශේෂඥ ලෙස ආචාර්ය අනුෂා අත්තනායක මහත්මිය සහභාගී විය.
- මීට අමතරව ඇය දේශීයව ජාතික සුපිරිසිදු නිෂ්පාදන මධ්‍යස්ථානය මඟින් දියත් කරන ලද පාරිසරික ලේබල් කිරීමේ ලේඛන සංවර්ධනය කිරීමේ නිර්නායක සැකසීම සඳහා තාක්ෂණික විශේෂඥ ලෙස සහභාගි විය.
- තවද ශ්‍රී ලංකා රේගුවේ නාමකරණ හා වර්ගීකරණ කමිටුව නියෝජනය කරමින් රබර් භාණ්ඩ ආශ්‍රිත වර්ගීකරණ ගැටළු විසඳීමට දායක විය.

දළ රබර් සැකසුම් සංවර්ධන හා රසායනික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

- කර්මාන්තකරුවන්ගේ සාම්පල 140 ක් පමණ පරීක්ෂා කොට සහතිකපත් නිකුත් කර ඇත.
- රබර් කර්මාන්තශාලා 10 ක් පමණ පරීක්ෂා කොට ඔවුන්ගේ ගැටළු විසඳා දී ඇත.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල සිසුන් සඳහා 'රබර් සැකසුම් තාක්ෂණය' මැයෙන් දෙදින වැඩමුළුවක් පවත්වන ලදී.
- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල සිසුන් සඳහා 'රබර් සැකසුම්කරණය' පිළිබඳ ප්‍රායෝගික පුහුණු සැසියක් පවත්වන ලදී.
- කැළණිය, ජයවර්ධනපුර, වයඹ, සබරගමුව සහ රජරට විශ්වවිද්‍යාල වල සිසුන් සඳහා 'දළ රබර් නිෂ්පාදන ක්‍රියාවලිය' පිළිබඳ පුහුණු වැඩසටහන් කරන ලදී.

ඩාර්ටන්ෆීල්ඩ් වතු සමූහය

- තක්සේරු කරන ලද බෝග අස්වැන්නෙන් 65.69% ක් ලබාදෙමින් කිලෝග්‍රෑම් 79369 ක මුළු අස්වැන්නක් ලබාගැනීමට සමාලෝචිත වසර තුල දී හැකි විය. පසුගිය වසර හා සංසන්දනය කිරීමේදී බෝග අස්වැන්න 6.13% කින් අඩුවී තිබුණි. නෙළන ලද මුළු අස්වැන්නෙන් 12.05% ක් වූ කිලෝග්‍රෑම් 9571 ක ප්‍රමාණයක් වැසි සහිත දින වලදී වැසි ආවරණ පවත්වාගෙන යාම හේතුවෙන් ලබා ගත හැකි වී තිබුණි.
- මෙම වර්ෂයේදී හෙක්ටයාරයකින් (Y.P.H) කිලෝග්‍රෑම් 477 ක සාමාන්‍ය අස්වැන්නක් ලබාගැනීමට හැකියාව ලැබුණු අතර පසුගිය වසරට සාපේක්ෂව හෙක්ටයාරයකින් ලබාගත් අස්වැන්න කිලෝග්‍රෑම් 17 කින් අඩු වී තිබුණි.
- මෙම වසර තුළ රබර් ගස් 195 ක කිරි කැපීමේ කර්තව්‍ය තුළින් ලබා ගත් කිලෝග්‍රෑම් 5.4 ක රබර් කිරි ප්‍රමාණය කිරි අස්වනු සහයකයකුගේ කිරි එකතු කිරීමේ සාමාන්‍ය විය. හෙක්ටයාර 1.09 භූමි ප්‍රමාණයක සිටුවා ඇති 2006 ක්ෂේත්‍රයේ මෙම වර්ෂය තුළ, එතුල් සහිතව දින තුනකට වරක් අර්ධ සර්පිලාකාර (S/2,D3) කිරි කැපුම් ක්‍රමය යටතේ RRIC 100/121 යන ක්ලෝනයන්ට අයත් ශාක 259 ක කිරි කැපීමෙන් කිරි අස්වනු සහයකයකු

ලබාගත් ඉහළම කිරි අස්වැන්න වශයෙන් කිලෝග්‍රෑම් 6.6 ක කිරි අස්වැන්නක් වාර්තා වී තිබුණි.

- වසර තුළ වාර්තාගත වූ සාමාන්‍ය වශයෙන්, ප්‍රමාද වී, වැස්සෙන් බාධා වූ, වැසි ආවරණ සහිතව කිරි කැපීම සිදු කල දින සංඛ්‍යාවන් සහ කිරි නොකැපූ මුළු දින ගණන අනුපිළිවෙලින් 194,18,01,88 හා 65 ක් විය.
- වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 5529.6 ක් වූ අතර, එය පෙර වර්ෂයට වඩා මිලිමීටර් 422 ක අඩුවීමක් වන අතරම, මෙම වර්ෂයේ දී වැසි දින 175 ක් වාර්තා වූ අතර, එය පෙර වර්ෂයේ දින හා සමාන වීමක් ලෙස ද දැක්විය හැකිය.
- මෙම වර්ෂයේ නිෂ්පාදන පිරිවැය (COP) සහ ශුද්ධ විකුණුම් සාමාන්‍යය (NSA) අනුපිළිවෙලින් කිලෝග්‍රෑම් 01 කට රු.778.94 ක් හා රු.836.58 ක් වූ අතර, කිලෝග්‍රෑම් 01 කින් රු. 57.64 ක ලාභයක් වාර්තා වූ අතර මුළු ලාභය රු.මිලියන 4.5 ක් විය. මෙම වසර සඳහා වාර්තාගත වූ ලාභය හෙක්ටයාර එකක් සඳහා රු. 27,498.65 ක් විය.
- 01 වන ශ්‍රේණිය යන තත්ත්ව මට්ටමින් නිෂ්පාදනය කළ ක්‍රේප් රබර් (Pale Crepe) ප්‍රමාණය රබර් අස්වැන්නෙන් 86% ක් විය.

කුරුවිට උප මධ්‍යස්ථානය

- සමාලෝචිත වසර තුළ දී, කිලෝග්‍රෑම් 40332 ක මුළු අස්වැන්නක් ලබා ගැනීමට හැකි වූ අතර, එය පසුගිය වසරේ රබර් කිරි අස්වැන්නට සාපේක්ෂව කිලෝග්‍රෑම් 263 ක අඩුවීමකි.
- මෙම වසරේ දී හෙක්ටයාරයකින් (Y.P.H) කිලෝග්‍රෑම් 540 ක සාමාන්‍ය අස්වැන්නක් ලබාගැනීමට හැකියාව ලැබුණු අතර, මෙම වසර තුළ මෙම වතුයායේ කිරි අස්වනු සහයකයකුගේ කිරි එකතු කිරීමේ සාමාන්‍යය කිලෝග්‍රෑම් 4.7 ක් වූ අතර, පූර්ව වර්ෂයේ අගයට වඩා කිලෝග්‍රෑම් 0.1 ක අඩුවීමක් දක්නට ලැබුණි.
- සමාලෝචිත වර්ෂය තුළ දී, සාමාන්‍ය, වැසි ආවරණ සහිත, ප්‍රමාද වී කිරි කැපූ හා කිරි නොකැපූ දින ගණන අනුපිළිවෙලින් 212, 45, 64 සහ 45 ක් විය.
- වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 5081.5 ක් වූ අතර, මෙම වර්ෂයේ දී වැසි දින 169 ක් වාර්තා විය. පෙර වසර තුල වර්ෂාපතනය මිලිමීටර් 5141.2 ක් වූ අතර, වැසි දින 158 ක් වාර්තා විය.
- මෙම වර්ෂයේ නිෂ්පාදන පිරිවැය (COP) සහ ශුද්ධ විකුණුම් සාමාන්‍යය (NSA) අනුපිළිවෙලින් කිලෝග්‍රෑම් 01 කට රු.739.03 ක් හා රු. 786.90 ක් විය. එබැවින් මෙම වර්ෂයේ මුළු ලාභය රු.මිලියන 1.9 ක් වාර්තාගත වූ අතර එම ලාභය හෙක්ටයාර එකක් සඳහා රු. 25,859.80 ක් විය.
- ක්‍රේප් රබර් (Pale Crepe) – 01 ශ්‍රේණිය තත්ත්ව මට්ටමින් නිෂ්පාදිත ප්‍රමාණය රබර් අස්වැන්නෙන් 75% ක් විය.

පොල්ගහවෙල උප මධ්‍යස්ථානය

- සමාලෝචිත වසර තුළ තක්සේරු කරන ලද බෝග අස්වැන්නෙන් 80.36% ක් වූ කිලෝග්‍රෑම් 18413 ක මුළු අස්වැන්නක් ලබාගැනීමට පොල්ගහවෙල උප මධ්‍යස්ථානයට හැකි විය. පසුගිය වසරේ දී ලබාගත් බෝග අස්වැන්නට සාපේක්ෂව බෝග අස්වැන්න 2.36% කින් අඩුවී තිබුණි. නෙළන ලද මුළු අස්වැන්නෙන් 24.3% ක් වූ කිලෝග්‍රෑම් 4475 ක ප්‍රමාණයක් වැසි සහිත දින වලදී වැසි ආවරණ පවත්වාගෙන යාම හේතුවෙන් ලබා ගත හැකි වී තිබුණි.


- මෙම වර්ෂයේ දී හෙක්ටයාරයකින් (Y.P.H) කිලෝග්‍රෑම් 1037 ක සාමාන්‍ය අස්වැන්නක් ලබාගැනීමට හැකියාව ලැබුණු අතර පසුගිය වසරට සාපේක්ෂව හෙක්ටයාරයකින් ලබාගත් අස්වැන්න කිලෝග්‍රෑම් 24 කින් අඩු වී තිබුණි.
- මෙම වසර තුළ, කිරි අස්වනු සහයකයකුගේ කිරි එකතු කිරීමේ සාමාන්‍ය කිලෝග්‍රෑම් 8.8 ක් විය. 2008 වගා ක්ෂේත්‍රය තුළ S/2 d3 කිරි කැපුම් ක්‍රම යටතේ ආර්ආර්අයිසී 121 (RRIC121) ක්ලෝනයට අයත් ශාක 240 ක කිරි කැපීමෙන් කිරි අස්වනු සහයකයකු ලබාගත් ඉහළම කිරි අස්වැන්න වශයෙන් කිලෝග්‍රෑම් 9.9 ක අස්වැන්නක් වාර්තාගත වී තිබුණි.
- සමාලෝචිත වර්ෂය තුළ දී, සාමාන්‍ය, වැස්සෙන් බාධා වූ, වැසි ආවරණ සහිත හා කිරි නොකැපූ දින ගණන අනුපිළිවෙලින් 214, 06, 98 සහ 48 ක් විය.
- වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 2918.6 ක් වූ අතර, එය පෙර වර්ෂයට වඩා මිලිමීටර් 136.3 ක වැඩිවීමක් වන අතරම, මෙම වර්ෂයේ දී වැසි දින 114 ක් වාර්තා වූ අතර, එය පෙර වර්ෂයට වඩා දින 08 ක අඩුවීමක් ලෙසද දැක්විය හැකිය.
- මෙම වර්ෂයේ නිෂ්පාදන පිරිවැය (COP) සහ ශුද්ධ විකුණුම් සාමාන්‍යය (NSA) අනුපිළිවෙලින් කිලෝග්‍රෑම් 01 කට රු.549.86 ක් හා රු. 674.41 ක් වූ අතර කිලෝග්‍රෑම් 01 කින් රු.126.76 ක ලාභයක් වාර්තා වූ අතර මුළු ලාභය රු.මිලියන 2.29 ක් විය. මෙම වසර සඳහා වාර්තාගත වූ ලාභය හෙක්ටයාර එකක් සඳහා රු. 189592.59 ක් විය.
- 01 වන ශ්‍රේණිය යන තත්ත්ව මට්ටමින් නිෂ්පාදනය කළ දුම් ගැසූ දාර රබර් (RSS) ප්‍රමාණය රබර් අස්වැන්නෙන් 75% ක් විය.


මොණරාගල උප මධ්‍යස්ථානය


- සමාලෝචිත වසර තුළ දී, කිලෝග්‍රෑම් 13859 ක මුළු අස්වැන්නක් ලබා ගැනීමට හැකි වූ අතර, එය පසුගිය වසරේ රබර් කිරි අස්වැන්නට සාපේක්ෂව කිලෝග්‍රෑම් 953 ක වැඩිවීමකි.
- මෙම වසරේ දී හෙක්ටයාරයකින් (Y.P.H) කිලෝග්‍රෑම් 1314 ක සාමාන්‍ය අස්වැන්නක් ලබාගැනීමට හැකියාව ලැබුණු අතර, පසු ගිය වර්ෂයට සාපේක්ෂව කිලෝග්‍රෑම් 85 ක වැඩිවීමකි.
- මෙම වසර තුළ මෙම වතුයායේ කිරි අස්වනු සහයකයකුගේ කිරි එකතු කිරීමේ සාමාන්‍යය කිලෝග්‍රෑම් 6.0 ක් වූ අතර, පූර්ව වර්ෂයේ අගයට වඩා කිලෝග්‍රෑම් 0.2 ක අඩුවීමක් දක්නට ලැබුණි.

මූල්‍ය ප්‍රකාශන

2024 මූල්‍ය වර්ෂය සඳහා පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් විශ්ලේෂණය කිරීම






ප්‍රාග්ධන වියදම් සංයුතිය- 2024
3%
20%
77%
පර්යේෂණ සහ සංවර්ධන
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම
සංවර්ධන ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය
මූල්‍ය ප්‍රකාශන – 2024

පටුන

		පිටු අංකය
2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය		60
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය		61
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය		62
ශුද්ධ වත්කම්/ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය		63
මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සඳහා ගිණුම් ප්‍රතිපත්ති		64-69
මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සඳහා සටහන්		70
සටහන 01	– මුදල් සහ මුදල් සමානතා	71
සටහන 02	– ලැබිය යුතු මුදල්	71
සටහන 03	– බඩු ලේඛන/තොග	72
සටහන 04	– කාරක ප්‍රගතිය	72
සටහන 05	– වෙනත් ජංගම වත්කම්	73
සටහන 06,07,08	– දේපල පිරියත සහ උපකරණ	74
සටහන 09	– ජීව විද්‍යාත්මක වත්කම්	74
සටහන 09 A	– වෙනත් මූල්‍ය වත්කම්	75
සටහන 10	– වෙළඳ සහ වෙනත් ගෙවීම්	76
සටහන 11	– කෙටි කාලීන ප්‍රතිපාදන	76
සටහන 12	– පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	77
සටහන 13	– සමුච්චිත අරමුදල	77
සටහන 14	– සමුච්චිත අතිරික්තය/හිඟය	78
සටහන 15	– වෙනත් රාජ්‍ය ආයතන වලින් මාරු කරන ලද මුදල්	79
සටහන 16	– වෙනත් ආදායම්	79
සටහන 17	– ආදායම් ඩාර්ටන්ෆීල්ඩ් වත්ත	80
සටහන 18	– ආදායම් කුරුවිට වත්ත	81
සටහන 19	– පුද්ගලික පාරිශ්‍රමික (පඩිනඩි)	82
සටහන 20	– සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය	83
සටහන 21	– නඩත්තු වියදම්	84
සටහන 22	– ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්	85
සටහන 23	– වෙනත් වියදම්	86
සටහන 24	– මූල්‍ය පිරිවැය	87
2024 වර්ෂය සඳහා මූල්‍ය කාරක ගිණුම - ඩාර්ටන්ෆීල්ඩ් වතුයාය		88
2024 වර්ෂය සඳහා මූල්‍ය කාරක ගිණුම - කුරුවිට වතුයාය		89

ශ්‍රමිකයන් සඳහා ගාස්තු අනුපාත සහ නිෂ්පාදන පිරිවැය ප්‍රභේදනය
ඩාර්ටන්ෆීල්ඩ් වතුයාය සහ කුරුවිට වතුයාය 90

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය
2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	2024		2023	
		රු		රු	
වත්කම්					
ජංගම වත්කම්					
මුදල් සහ මුදල් සමානතා	1	52,834,501.88		75,981,243.89	
ලැබිය යුතු මුදල්	2	20,458,281.51		13,178,435.88	
බඩු ලේඛන	3	22,747,726.56		23,130,232.16	
කාර්ය ප්‍රගතිය	4	-		4,699,830.83	
වෙනත් ජංගම වත්කම්	5	11,266,012.35		30,629,606.27	
		-		-	
මුළු ජංගම වත්කම්			**107,306,522.30**		**147,619,349.03**
ජංගම නොවන වත්කම්					
දේපල පිරියත සහ උපකරණ					
ඉඩම් සහ ගොඩනැගිලි	6	4,558,467,279.59		4,570,509,655.20	
පිරියත සහ යන්ත්‍රෝපකරණ	7	285,994,226.34		259,012,929.54	
අස්පෘෂ්‍ය වත්කම්	8	152,400.18		517,261.75	
ජීව විද්‍යාත්මක වත්කම්	9	24,299,213.72			
වෙනත් මූල්‍ය වත්කම්	9A	123,483,225.83		115,442,031.57	
මුළු ජංගම නොවන වත්කම්			**4,992,396,345.66**		**4,945,481,878.06**
මුළු වත්කම්			**5,099,702,867.96**		**5,093,101,227.09**
වගකීම් සහ ශුද්ධ වත්කම්					
ජංගම වගකීම්					
වෙළඳ සහ වෙනත් ගෙවීම්	10	35,415,431.20		26,881,452.90	
කෙටි කාලීන ප්‍රතිපාදන	11	1,485,888.00	36,901,319.20	1,331,631.00	28,213,083.90
මුළු ජංගම වගකීම්					
ජංගම නොවන වගකීම්					
සේවක ප්‍රතිලාභ	12	132,629,223.62	132,629,223.62	132,397,173.50	132,397,173.50
මුළු ජංගම නොවන වගකීම්					
මුළු වගකීම්			**169,530,542.82**		**160,610,257.40**
මුළු ශුද්ධ වත්කම් / සාමාන්‍ය කෙ			**4,930,172,325.14**		**4,932,490,969.69**
සමුච්චිත අරමුදල	13	11,729,747.15		23,269,189.79	
සමුච්චිත අතිරික්තය (හිඟය)	14	350,595,892.34		472,953,094.24	
ප්‍රත්‍යාගණන අතිරික්තය (හිඟය)		4,567,846,685.65		4,436,268,685.66	
මුළු ශුද්ධ වත්කම් / සාමාන්‍ය කොටස්			**4,930,172,325.14**		**4,932,490,969.69**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට (SLPSAS) අනුව පිළියෙල කර ඇත.

බී එස් එස් හේවගේ මයා
ජ්‍යේෂ්ඨ ගණකාධිකාරී - ර ප ආ

ආචාර්ය එස් පී විතානගේ
අතිරේක අධ්‍යක්ෂ - ර ප ආ

පිටු අංක 60 සිට 89 දක්වා වාර්තා තබා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය කොටසකි . පාලක මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකිව යුතු අතර පාලක මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කර ඒ වෙනුවෙන් අත්සන් තබා ඇත.

ආචාර්ය ප්‍රියන්ත වීරසිංහ
සභාපති - රබර් පර්යේෂණ මණ්ඩලය

එච්.එන්.එස්.ටී.කේ. ද සිල්වා මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික රබර් පර්යේෂණ මණ්ඩලය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

විස්තරය	සටහන්	අයවැය	2024		2023	
ආදායම්						
වෙනත් රාජ්‍ය ආයතන වලින් මාරු කරන ලද මුදල්	15	415,920,000.00	444,209,442.64		512,367,454.66	
වෙනත් ආදායම්	16	90,000,000.00	37,972,807.91		47,534,038.47	
විලම්බිත ආදායම්						
ඩාර්ටන් ෆීල්ඩ් වත්න - දළ ආදායම	17	97,466,920.00	73,538,247.85		77,560,445.20	
මොනරාගල වත්න - දළ ආදායම		6,000,000.00	8,108,488.32		5,675,480.76	
කුරුවිට වත්න - දළ ආදායම	18	36,722,745.00	38,290,664.54		34,348,185.19	
මුළු ආදායම				602,119,651.26		677,485,604.28
වියදම						
වේතන වැඩුප් හා සේවක ප්‍රදාන ප්‍රතිලාභ වෙනත් සංක්‍රමණ ගෙවීම්	19	425,811,207.00	373,984,957.79		354,446,535.50	
සැපයුම් හා භාවිත කරන ලද පරිභෝජන භාණ්ඩ	20	39,093,453.00	38,963,836.87		41,862,016.72	
නඩත්තු වියදම	21	57,740,835.00	61,847,977.43		57,173,126.74	
ක්ෂය හා ක්‍රමක්ෂය කරන ලද වියදම	22		127,053,971.92		163,536,106.54	
වෙනත් වියදම්	23	120,850,497.00	120,945,903.31		131,018,063.09	
මූල්‍ය පිරිවැය	24	198,000.00	246,729.72		59,750.00	
මුළු වියදම				723,043,377.04		748,095,598.59
කාලසීමාව සඳහා ඇතිරික්කය (හිඟය)				**(120,923,725.78)**		**(70,609,994.31)**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ඒකාබද්ධ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	2024		2023	
මෙහෙයුම් ක්‍රියාකාරකම්	රු.		රු.	
මෙහෙයුම් ක්‍රියාකාරකම්	**(120,923,726)**		**(70,609,994)**	
මූල්‍ය නොවන සංචලන				
එකතු කළා- ක්ෂය	127,053,972		163,536,107	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	16,542,160		16,135,607	
බොල්ණය සඳහා ප්‍රතිපාදන	(15,882)		(1,075,052)	
කෙටිකාලීන ප්‍රතිපාදන	154,257		(4,348,216)	
(ලාභය) / දේපළ කම්හල සහ උපකරණ විකිණීමෙන් ඉ	2,315,000			
පෙර වසරේ ලාභ ගැලපීම	(881,524)			
අඩු කළා - ආයෝජන සඳහා පොළිය	(2,298,510)		(5,717,197)	
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් සිදු කිරීමට පෙර ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**21,945,747**		**97,921,254**	
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්				
ගෙවිය යුතු මුදල් අඩුවීම් / වැඩිවීම	8,533,978		(514,688)	
වෙනත් ජංගම වත්කම් වල අඩුවීම් /වැඩිවීම	17,166,085		32,114,605	
(වැඩි කිරීම) / ජීව විද්‍යාත්මක වත්කම් අඩු කිරීම	(24,299,214)			
පාරිතොෂික ගෙවීම්	(16,310,110)		(46,665,774)	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය		**7,036,487**		**82,855,398**
ආයෝජන ක්‍රියාකාරකම්				
දේපල පිරියන සහ උපකරණ මිලදී ගැනීම්	(27,701,244)		(95,266,009)	
වෙනත් මූල්‍ය වත්කම්	(8,041,194)		(10,761,303)	
ආයෝජන මත පොළී ආදායම	2,313,107		5,320,211	
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය		**(33,429,332)**		**(100,707,101)**
මූල්‍ය ක්‍රියාකාරකම්				
ප්‍රාග්ධන ප්‍රදාන සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු	-		3,991,684	
විශේෂ ව්‍යාපෘති සඳහා ලැබුණු අරමුදල්	3,246,103		14,993,861	
නැවත ගෙවීම් - NSF ප්‍රදාන			(72,668)	
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය		**3,246,103**		**18,912,878**
වසර සඳහා ශුද්ධ මූල්‍ය ප්‍රවාහය		**(23,146,742)**	-	**1,061,174**
වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමානතා		**75,981,244**		**74,920,070**
වසර අවසානයේදී මුදල් හා මුදල් සමානතා		**52,834,502**		**75,981,244**
ලංකා බැංකුව - ගිණුම් අංක .335976		2,715,214		20,500,817
ලංකා බැංකුව (කුරුවිට) - ගිණුම් අංක .4320540		6,239,353		1,455,536
ලංකා බැංකුව (ඩාර්ටන් ෆීල්ඩ්) - ගිණුම් අංක .335978		3,304,452		138,007
ලංකා බැංකුව - ගිණුම් අංක .1837		21,549,483		32,738,474
ඉන්දන කූපන් අග්‍රිමය - පුධාන කාර්යාලය		282,000		136,000
ඉන්දන කූපන් අග්‍රිමය - රත්මලාන		44,000		5,000
ආයෝජන - පාරිතෝෂික අරමුදල (කුරුවිට)		18,700,000		18,000,000
ආයෝජන - පාරිතෝෂික අරමුදල (ඩාර්ටන්ෆීල්ඩ්)				3,000,000
සුළු මුදල් -ඩාර්ටන් ෆීල්ඩ්				1,010
සුළු මුදල් -කුරුවිට				6,400
එකතුව		**52,834,502**		**75,981,244**

2024 12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

රු

	සමුච්චිත අරමුදල (ප්‍රදාන)	නැවත තාක්ෂේරු සංචිත	සමුච්චිත අතිරික්තයන්/(හිඟයන්)	**එකතුව**
ශේෂය 01.01.2021	1,056,728,472.15	174,722,678.56	(21,171,147.94)	1,210,280,002.77
දේපල ප්‍රත්‍යාගණනය මත ලාභය / අලාභය		5,715,350.00		5,715,350.00
2021 ශුද්ධ වත්කම් / හිමිකම් වල වෙනස			15,873,555.17	15,873,555.17
පූර්ව වසර සඳහා ගැළපීම්	(388,154,783.16)		(993,537.99)	(389,148,321.15)
වත්කම් ඉවත්කිරීමේ අතිරික්තය / හිඟය			-	-
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**668,573,688.99**	**180,438,028.56**	**(6,291,130.76)**	**842,720,586.79**
ශේෂය 01.01.2022	668,573,688.99	180,438,028.56	(6,291,130.76)	842,720,586.79
දේපල ප්‍රත්‍යාගණනය මත ලාභය / අලාභය		4,267,011,821.80		4,267,011,821.80
2022 ශුද්ධ වත්කම් / හිමිකම් වල වෙනස			6,367,157.67	6,367,157.67
පූර්ව වසර සඳහා ගැළපීම්	(117,988,795.15)		10,336,717.95	(107,652,077.20)
වත්කම් ඉවත්කිරීමේ අතිරික්තය / හිඟය			(640,000.00)	(640,000.00)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**550,584,893.84**	**4,447,449,850.36**	**9,772,744.86**	**5,007,807,489.06**
ශේෂය 01.01.2023	**550,584,893.84**	**4,447,449,850.36**	**9,772,744.86**	**5,007,807,489.06**
පූර්ව වසර සඳහා ගැළපීම් (ප්‍රධාන)	(546,228,581.58)		546,228,581.58	-
පූර්ව වසර සඳහා ගැළපීම්			(12,181,570.89)	**(12,181,570.89)**
2023 දී ලැබුණු ප්‍රදානය	124,102,000.00			**124,102,000.00**
ආදායමට මාරු කිරීම	(105,116,454.00)			**(105,116,454.00)**
NSF ප්‍රදානය	(72,668.47)			**(72,668.47)**
දේපල නැවත තාක්ෂේරු කිරීමේදී සිදුවන පාඩුව		(11,181,164.70)		**(11,181,164.70)**
වත්කම් අතිරික්තයන් බැහැර කිරීම / (හිඟයන්)			(256,667.00)	**(256,667.00)**
කාල සීමාව සඳහා අතිරික්තයන් / හිඟය			(70,609,994.31)	**(70,609,994.31)**
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**23,269,189.79**	**4,436,268,685.66**	**472,953,094.24**	**4,932,490,969.69**
ශේෂය 01.01.2024	**23,269,189.79**	**4,436,268,685.66**	**472,953,094.24**	**4,932,490,969.69**
2024 සඳහා ශුද්ධ වත්කම්/කොටස්වල වෙනස				-
පාඩුව / දේපල මත ලාභය නැවත ඇගයීම				-
පෙර වසර ගැලපීම (ප්‍රදාන)				-
පෙර වසර ගැලපීම			881,523.88	**881,523.88**
ආදායමට මාරු කිරීම	(11,539,442.64)			**(11,539,442.64)**
දේපල නැවත තාක්ෂේරු කිරීම		131,577,999.99		**131,577,999.99**
අතිරික්ත වත්කම් බැහැර කිරීම / (හිඟ)			(2,315,000.00)	**(2,315,000.00)**
කාලය සඳහා අතිරික්ත / හිඟය			(120,923,725.78)	**(120,923,725.78)**
2024 දෙසැම්බර් 31 දින ශේෂය	**11,729,747.15**	**4,567,846,685.65**	**350,595,892.34**	**4,930,172,325.14**

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන වලට ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්

මූල්‍ය ප්‍රකාශන වලට ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. සංස්ථාපිත තොරතුරු

1.1 වාර්තාකරණ ආයතනය

රබර් පර්යේෂණ ආඥා පනත යටතේ රාජ්‍ය සංස්ථාවක් ලෙස ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය (RRB) ස්ථාපනය කර තිබේ. මෙම ආඥා පනත කලින් කලට සංශෝධනය කර ඇති අතර "2003 අප්‍රේල් මාසයේ සම්මත කර ගන්නා ලද අංක 28 දරන සංශෝධනය සහිත රබර් පර්යේෂණ පනත් කෙටුම්පතේ 2 වන කොටස" ඉතාම මෑතකදී හඳුන්වා දෙන ලද සංශෝධනය වේ. එසේම ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය (RRB) කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන අතර එහි ලියාපදිංචි කාර්යාලය රත්මලානේ තෙලවල පාරේ පිහිටා තිබේ.

මෙම ආයතනය රබර් පර්යේෂණ මණ්ඩලය මගින් පාලනය වේ. රබර් පර්යේෂණ ආඥා පනතට අනුව, මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 15 දෙනෙකුගෙන් සමන්විත අතර ඉන් එක් සාමාජිකයෙකු මණ්ඩලයේ සභාපති ලෙස පත් කරනු ලැබේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වාභාවය

ආර්ථික වශයෙන් සහ පාරිසරික වශයෙන් තිරසාර නවෝත්පාදන වැඩි දියුණු කිරීම සහ පුහුණු කිරීම සහ උපදේශන සේවා තුළින් පාර්ශවකරුවන් වෙත නවතම තාක්ෂණික ක්‍රම ලබා දීම තුලින් රබර් කර්මාන්ත අංශයට පුනර්ජීවයක් ලබා දීම ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ (RRB) මෙහෙවර වේ.

1.3 සේවකයන් සංඛ්‍යාව

2024 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව 285 වූ අතර එයට සාපේක්ෂව 2023 වර්ෂයේ ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව 290 ක් විය.

1.4 මූල්‍ය වර්ෂය

2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මාස 12 ක කාලය ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය වර්ෂය වේ.

1.5 නිකුත් කිරීම සඳහා බලය ලබා දුන් දිනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රබර් පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය වාර්තා නිකුත් කිරීම සඳහා කළමණාකරණ කමිටුව මගින් 2025 මාර්තු 19 දින අනුමැතිය ලබා දී ඇත.

2. සැලකිය යුතු ගිණුම් ප්‍රතිපත්ති

2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ පදනම

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබේ.

2.2 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශණ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව පිළියෙළ කර තිබේ.

2.3 සංසන්දනාත්මක තොරතුරු

ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, පෙර වර්ෂයේ භාවිතා කළ ඒවාට අනුකූල වේ. ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි අවශ්‍ය තැන් වලදී පෙර වර්ෂයේ සංඛ්‍යා සහ වාක්‍ය ඛණ්ඩ නැවත සකස් කර ඇත.

2.4 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනෙන් පසු සියලු වැදගත් සිදුවීම් සලකා බලා ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලීම් සිදු කිරීම හෝ සටහන් මගින් හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

2.5 එකතු කළ අගය මත බද්ද (VAT)

එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන යටතේ මණ්ඩලය වත්මන් වර්ෂයේදී VAT බද්දට යටත් වේ

2.6 වත්කම් සහ තක්සේරු පදනම

2.6.1 දේපළ, පිරියත හා උපකරණවල පිරිවැයෙන් ක්ෂය කිරීම අඩු කොට ලැබෙන අගයට දේපළ, පිරියත හා උපකරණ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය යනු දේපළ, පිරියත හා උපකරණවල වෙළඳපල වටිනාකම හෝ කිසියම් අනියම් වියදමක් සහිතව මිලදී ගැනීමේ පිරිවැය වේ.

